# මහ සභා රැස්වීම - 2025.06.26 දින
# අලව්ව ප්‍රාදේශීය සභාව

2025.06.26 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ දෙවන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවිර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**මෙදිනසහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එස්.එම්. යසින්තා සජීවනී සේනාරත්න මැතිනිය

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ දෙවන මහ සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමිය ප්‍රධාන සියලු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මා ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. එමෙන්ම, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය සහ එම නිළධාරීන් සියලු දෙනාත්, මේ අවස්ථාවට සම්බන්ධවන මාධ්‍ය වේදීන් සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01. 2025.06.12 වන දින විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

2025.06.12 වන දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව සභා සම්මත කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2025.06.12 වන දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පසුගිය වාර්තාවේ මගේ කතාවේ පොඩි අඩුපාඩුවක් තියනවා. මගේ කතාවේ දී "අලව්ව ප්‍රාදේශීය සභාව නියෝජනය කරන හතර වන අවස්ථාව. 1997 ලංකාවේ ලාබාලතම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා හැටියට අලව්ව ප්‍රාදේශීය සභාව(නාරම්මල) නියෝජනය කළා. නමුත් එතනින් පස්සේ ඇතුළත් වෙලා නැහැ. 2002 වර්ෂයේ නැවත සභාව නියෝජනය කළා කියන ප්‍රකාශයත් සටහන් වෙලා නැහැ. ඒ වගේම 2015 වසරේ මම අමාත්‍යවරයෙකුගේ ලේකම්වරයෙක් වශයෙන් කටයුතු කළ නිසා අලව්ව ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වුණේ නැහැ."යන ප්‍රකාශයත් මගේ කතාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම සංශෝධනවලට යටත්ව, සභා වාර්තාව සම්මත කිරීම මා ස්ථිර කරනවා

ඒ අනුව, 2025.06.12 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනවලට යටත්ව සභා සම්මත විය.

## 02.ගරු සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන

### 02.1 සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමේදී මාර්ග නාමයන් භාවිතා කිරීම සම්බන්ධව

අලව්ව ප්‍රාදේශීය සභාව සතු පාරවල් හා පටුමාවත් සංවර්ධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේදී, මාර්ග නාමයන් යොදාගත යුතු ආකාරය සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අංක 2021/01 දරණ 2021.08.04 දිනැති චක්‍රලේඛයේ 3.7 වගන්තිය මගින් වයඹ පළාතේ සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව පාරවල් හා පටුමාවත් සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා උක්ත චක්‍රලේඛය අදාල කරගත යුතු බැවින් ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා විසින් සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමේදී ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් කර ඇති මාර්ග නාමයන් භාවිතා කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

එමෙන්ම අලව්ව ප්‍රාදේශීය සභාව සතු පාරවල් හා පටුමාවත්වල නාම ලේඛනයක් අංක 2284/02 දරණ 2022.06.13 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් හා අංක 2367/15 දරණ 2024.01.19 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර අදාල ගැසට් පත්‍රසහ ඩිජිටල්කරණය කරන ලද මාර්ග ජාලය අලව්ව ප්‍රාදේශීය සභාවේ නිල වෙබ් අඩවිය (alawwaps.lk) මගින් පරිහරණය කල හැකි බව දැනුම් දීම සභාගත කරන ලදී.

**02.2 සංවර්ධන වැඩසටහන් සඳහා ලබා දෙන ප්‍රතිපාදන වලට අදාලව සිදුකලයුතු ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇති පරිදි පහත දක්වා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇති ප්‍රසම්පාදන කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදුකල යුතු බවත්, ඇස්තමේන්තු සකස් කිරීම හා අධීක්ෂණ කටයුතු අවශ්‍යතාවය පරිදි රජයේ ආයතනයකින් ලබා ගැනීමට හැකියාව පවතින බවත්, එබැවින් පහත ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඇස්තමේන්තු සකස් කර ක්‍රියාත්මක කිරීම හෝ ප්‍රාදේශීය සභාව මගින් ඇස්තමේන්තු සකස් කර අධීක්ෂණ කටයුතු සිදු කිරීම යන ක්‍රමවේද භාවිතා කර ඇති බවත්, මෙම සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ආරම්භ කල යුතු බැවින් මේ සඳහා එකඟතාවය ලබා දෙන ලෙස අලව්ව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා එවා ඇත.

| අනු අංකය | වැඩසටහන | ව්‍යාපෘතියේ නම | වෙන්කල මුදල (රු) |
|---|---|---|---|
| 01 | විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 | හල්ගහමුල වත්ත අලුත්වත්ත පාර දක්වා මාර්ගයේ අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් දමා සංවර්ධන කිරීම. | 2,000,000.00 |
| 02 | විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 | අලව්ව ගිරිඋල්ල මාර්ගයේ 8 කණුව මංසන්ධියේ සිට මිරිහෙලිය දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම. | 2,000,000.00 |
| 03 | විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 | උඩගම සිට ගල්බොක්ක දක්වා දිවෙන මාර්ගය අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 04 | විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 | අග්බෝව පන්සල අසලින් කිරිමැටිය හරහා ඉඹුල්ගොඩ දක්වා දිවෙන මාර්ගය අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 05 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2025 | නුගවෙල එක්සත් මරණාධාර සමිති ශාලා පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 500,000.00 |
| 06 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2025 | නුගවෙල අමුණෝවිට පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 500,000.00 |
| 07 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2025 | ඉහළ වළකුඹුර ළදරු පාසල් මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 08 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2025 | කෝහිටියාව අඹඋල්වත්ත පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 09 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2025 | පරමාඋල්ල නුගගහමුලහේන ප්‍රවේශ දෙපස කාණු පද්ධතිය සකස් කර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 10 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2025 | වැලිහිද පරගහමුලවත්ත පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 11 | පළාත් ආයෝජන වැඩසටහන - 2025 | 994 - හෙණ්ඩුවාව වසමේ දුන්දෙණිය ජනපදයේ කරුණාරත්න මහතාගේ නිවස අසලින් ඇති ඇල මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම | 500,000.00 |

**02.3 නවක මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ සැලසුම් කිරීම පිළිබඳව ප්‍රාදේශීය සභාවේ නවක මන්ත්‍රීවරුන් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා සැලසුම් කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සැලසුම් අධ්‍යක්ෂකගේ සහයෝගයෙන් නාරම්මල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී 2025.06.26 දින ප.ව. 02.00 ට පැවැත්වීමට සැලසුම්

කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමන්ලා එම වැඩසටහන සඳහා සම්බන්ධ කරවීමට කටයුතු කරන ලෙසත් දන්වා නාරම්මල ප්‍රාදේශීය සභාව විසින් ලිපියක් යොමු කර තිබෙනවා.

**03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම - නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05. යථා පරිදි කල්දී ඇති යෝජනා**

**(05-1) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/01 දරණ යෝජනාව**

අංක 1891 දරණ2014.11.28 දිනැති (iv (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන)ගැසට් පත්‍රයට අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත රු. 3000.00 ක උපරිමයකට යටත්ව මාසිකව සන්නිවේදන දීමනාවක් ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්දමාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අංක 1891 දරණ 2014.11.28 දිනැති (iv (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන) ගැසට් පත්‍රයට අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත රු. 3000.00 ක උපරිමයකට යටත්ව මාසිකව සන්නිවේදන දීමනාවක් ගෙවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-2) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/02 දරණ යෝජනාව**

අංක 2092/10දරණ 2018.10.08 දිනැති (iv (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන)ගැසට් පත්‍රයට අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත රු. 3000.00 ක උපරිමයකට යටත්ව මාසිකව ප්‍රවාහන දීමනාවක් ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අංක 2092/10 දරණ 2018.10.08 දිනැති (iv (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන) ගැසට් පත්‍රයට අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත රු. 3000.00 ක උපරිමයකට යටත්ව මාසිකව ප්‍රවාහන දීමනාවක් ගෙවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**05-3) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/03 දරණ යෝජනාව**

අංක 1508/14 දරණ 2017.07.31 දිනැති (iv (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන) ගැසට් පත්‍රය අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත රු. 500.00 ක උපරිමයකට යටත්ව එක් කාරක සභා රැස්වීමකට සහභාගී වීම වෙනුවෙන් රු.250.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අංක 1508/14 දරණ 2017.07.31 දිනැති (iv (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන) ගැසට් පත්‍රය අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත රු. 500.00 ක උපරිමයකට යටත්ව එක් කාරක සභා රැස්වීමකට සහභාගී වීම වෙනුවෙන් රු.250.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**05-4) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/04 දරණ යෝජනාව</u>**

අංක 1897/13 දරණ 2015.01.16 දිනැති (iv (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන) ගැසට් පත්‍රය අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත පහත අනුප්‍රමාණ වලට අනුකූලව මාසික දීමනාවක් ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

- සභාපති - රු. 25,000.00
- උප සභාපති - රු. 20,000.00
- සභිකයින් - රු. 15,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අංක 1508/14 දරණ 2017.07.31 දිනැති (iv (අ) වැනි කොටස - පළාත් සභා නිවේදන) ගැසට් පත්‍රය අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වෙත රු. 500.00 ක උපරිමයකට යටත්ව එක් කාරක සභා රැස්වීමකට සහභාගී වීම වෙනුවෙන් රු.250.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**05-5) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/05 දරණ යෝජනාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 වන වගන්තිය ප්‍රකාරව වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල හා වගකීම් වලට යටත්ව,අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින්,පීඩා පිළිබඳ ආඥා පනතින් ,නිවාස හා නගර සංවර්ධන අඥාපනතින් සහ ඒ සඳහා තත්කාලයේ බල පවත්නා ලිඛිත නීතියකින් ඊට පවරා ඇති පොදු බලතල,ඒ කාර්යය සඳහා ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලතල අලව්ව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී එස්.එල්. සිංහපතිරණ මහතාටත් ඔහු විසින් තමන් වෙත සතුකරනු ලැබූ බලතල වලින් සුදුසු යැයි හැඟෙන යම් බලතල ඔහු යටතේ රාජකාරී කරනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ටත් පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 වන වගන්තිය ප්‍රකාරව වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල හා වගකීම් වලට යටත්ව,අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින්,පීඩා පිළිබඳ ආඥා පනතින් ,නිවාස හා නගර සංවර්ධන අඥාපනතින් සහ ඒ සඳහා තත්කාලයේ බල පවත්නා ලිඛිත නීතියකින් ඊට පවරා ඇති පොදු බලතල,ඒ කාර්යය සඳහා ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලතල අලව්ව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී එස්.එල්. සිංහපතිරණ මහතාටත් ඔහු විසින් තමන් වෙත සතුකරනු ලැබූ බලතල වලින් සුදුසු යැයි හැඟෙන යම් බලතල ඔහු යටතේ රාජකාරී කරනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ටත් පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**05-6) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/06 දරණ යෝජනාව**

වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති අංක ව/පපාදෙ/3/6/3/4 දරණ 2019.05.23 දිනැති ලිපියට අනුව ගරු සභාපතිතුමාගේ පුද්ගලික සහකාර ලෙස 80/1, නාරම්මල පාර, අලව්ව ලිපිනයේ එම්.එම්. යසිරු චන්දිම බණ්ඩාර මහතා පත්කිරීමත්, ඔහු සඳහා රු. 22,000.00 ක මාසික දීමනාවක් ලබාදීමත් සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති අංක ව/පපාදෙ/3/6/3/4 දරණ 2019.05.23 දිනැති ලිපියට අනුව ගරු සභාපතිතුමාගේ පුද්ගලික සහකාර ලෙස 80/1, නාරම්මල පාර, අලව්ව ලිපිනයේ එම්.එම්. යසිරු චන්දිම බණ්ඩාර මහතා පත්කිරීමත්, ඔහු සඳහා රු. 22,000.00 ක මාසික දීමනාවක් ලබාදීමත් සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**05-7-1) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/07-1 දරණ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම පිණිස සභාවේ සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් සංවර්ධන උපදේශක කාරක සභාවපත් කිරිම සහ පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**සංවර්ධන උපදේශක කාරක සභාව**

1. ගරු සභාපති පී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මී කාන්ති ඥාණලතා මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
13. ඒ.ඩී.එස්.ආර්. විජේසිංහ මහතා, විශ්‍රාමික කම්කරු කොමසාරිස්, බතලවත්ත, අලව්ව
14. කර්නල් පද්මා චන්ද්‍රලතා මහත්මිය, ජයම්වත්ත, හුම්බුළුව, අලව්ව
15. එම්.පී.සී. රේණුකා මහත්මිය, ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව
16. කේ.ඒ.අයි.එස්. කළුආරච්චි මහත්මිය, ප්‍රජා සංවර්ධන නිලධාරී
17. වයි.එම්.එම්.ටී.බී. උඩවෙල මහතා, වැඩ අධිකාරී
18. එච්.එම්.එච්. හේරත් මහත්මිය, සංවර්ධන නිලධාරී (ජල හා සනීපාරක්ෂක)
19. ආර්.එම්. අජන්තා රණසිංහ මහත්මිය, සංවර්ධන නිලධාරී (ආදායම් ප්‍රවර්ධන)
20. ජේ.එම්.ඩී. ජයකඩු මහත්මිය, සංවර්ධන නිලධාරී (පරිසර)
21. එස්.එම්. සුදුසිංහ මහත්මිය, සංවර්ධන නිලධාරී

**<u>සංවර්ධන උපදේශක කාරක සභාවට පැවරී ඇති බලතල -</u>**

1. බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා අනුව සිදුකළයුතු සංවර්ධන වැඩසටහන් නිර්දේශ කර සභාව වෙත ඉදිරිපත් කිරීම.
2. සභාව වෙත පැමිණෙන මහජන පැමිණිලි විමර්ශනය කිරීම හා ඒ පිළිබඳ ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සභාව වෙත වාර්තා කිරීම.
3. බල ප්‍රදේශයේ උද්ගතවන ගැටුම් නිරාකරණය කිරීම සඳහා වන නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම.
4. නව ආදායම් උත්පාදන ව්‍යාපෘති හඳුනාගෙන සභා අනුමැතියට ඉදිරිපත් කිරීම.
5. සභාවේ දැක්ම සහ මෙහෙවර ලඟාකරගැනීම සඳහා අවශ්‍ය උපදෙස් සභාව වෙත ඉදිරිපත් කිරීම.
6. සභාවේ ශක්තීන් දුර්වලතා අවස්ථා සහ තර්ජන වෙන වෙනම හදුනාගැනීම සහ දුර්වලතා සහ තර්ජන අවම කිරීම සඳහා වන නිර්දේශ සභාව වෙත ඉදිරිපත් කිරීම.
7. සභාවේ සියළුම සැලසුම් ක්‍රමානුකූලව ක්‍රියාත්මක වන්නේ දැයි විමසා බැලීම.
8. කාර්යාලය තුළ පංචවිධ(5එස්) සංකල්පය නිවැරදිව ක්‍රියාත්මක කිරීම සඳහා සිදුකළයුතු කාර්යන් පිළිබඳ නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි , ඔබතුමා විසින් ඉදිරිපත් කරපු යෝජනාව මම ස්ථිර කරන අතරම , ඉදිරිපත් කර ඇති කමිටු පහටම මම යෝජනා කරනවා අපේ බල ප්‍රදේශය තුල අපිට මේකට සම්බන්ධ කරගන්න පුළුවන් පුද්ගලයින් ඉන්නවා. විශේෂයෙන්ම උදාහරණයක් විදිහට විශ්‍රාම ගිය විදුහල්පතිවරුන් බොහෝ දෙනෙක් ඉන්නවා.

සංවර්ධන උපදේශන කාරක සභාව සඳහා ඉහත සංයුතියට අමතරව ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් කාරක සභාව සඳහා සම්බන්ධ වීමට කැමති සහ සුදුසු අය ඇතුලත් කරමින් සංශෝධනයන් සහිතව නැවත සංයුතිය සකස් කර ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු සභාපති පී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා , තුමියන්ලා සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මේ සඳහා මේ සභාවේදීම යෝජනා කිරීම අවශ්‍ය වෙනවා කියන එක තමයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි , කමිටුවලට සම්බන්ධ කරගන්න කැමති මන්ත්‍රීවරු ඉන්නවනම් මේ සභාවේ නැගිටලා කැමති බව කියන්න

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සංවර්ධන උපදේශන කාරක සභාව සඳහා කොස්ඉන්න, මහරච්චිමුල්ල ලිපිනයේ ඉංජිනේරු පුෂ්ප කුමාර අධිකාරී මහතා සුදුසු යැයි යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සංවර්ධන උපදේශන කාරක සභාව සඳහා ගරු මන්ත්‍රීවරුන් දෙනෙකුගේ නම් සුදුසු යැයි යෝජනා කරමි.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්දමාල් මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය**
ගරු සභාපතිතුමනි , ඉහත සංශෝධන වලට යටත්ව එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම පිණිස සභාවේ සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත ඉහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් සංවර්ධන

උපදේශක කාරක සභාව පත් කිරිම හා ඉහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-7-2) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/07-2 දරණ යෝජනාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දිම පිණිස සභාවේ සභිකයන්ගෙන් හෝ කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ආපදා කළමනාකරණ කාරක සභාව පත් කිරිම සහ පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**ආපදා කළමනාකරණ කාරක සභාව**

1. ගරු සභාපති පී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවිර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එස්.එම්. යසින්තා සජීවනී සේනාරත්න මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය
27. එම්.ඒ.ජී.ජී.ආර්. සමීර රණතුංග මහතා, 471, පිලවතුර, මහරච්චිමුල්ල
28. ආර්.ඒ. උමේෂ් චින්තක ජයසිංහ මහතා, මලඇලවත්ත, ගලතරය, අලව්ව
29. ඩබ්.ඒ.ජී. වීරසේකර මහතා, විශ්‍රාමික ගුරු, නො. 338/3, දොඩම්කුඹුරවත්ත, අලව්ව
30. ජේ.එච්. කරුණා ජයමහ, විශ්‍රාමික ගුරු, නන්දන, පරමාඋල්ල, අලව්ව
31. එම්.පී.සී. රේණුකා මහත්මිය, ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව
32. කේ.ඒ.අයි.එස්. කළුආරච්චි මහත්මිය, ප්‍රජා සංවර්ධන නිලධාරී
33. වයි.එම්.එම්.ටී.බී. උඩවෙල මහතා, වැඩ අධිකාරී

**<u>ආපදා කළමනාකරණ කාරක සභාවට පැවරී ඇති බලතල -</u>**

1. බල ප්‍රදේශයේ සිදුවන හදිසි ආපදා තත්වයන් වලදී එම තත්වයෙන් ජනතාවමුදා ගැනීම සඳහා ක්ෂණික තීරණ ගෙන ක්‍රියාත්මක කිරීම සහ ඒ පිළිබදව සභාව දැනුවත් කිරීම
2. හදිසි ආපදාවලදී විනාශවන භෞතිකසම්පත් සංවර්ධනය සඳහා වන යෝජනා සකස් කර මහ සභාව වෙත ඉදිරිපත් කිරීම
3. හදිසි ආපදාවකට ලක්විය හැකි ප්‍රදේශ කල් ඇතිව හදුනාගැනීම සහ එම ආපදා වලක්වා ගැනිම සඳහා වන යෝජනා මහ සභාවට ඉදිරිපත් කිරීම

4. හදිසි ගිනිගැනීම් තත්වයන් වලදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ අවශ්‍ය උපදෙස් මහ සභාව වෙත දැනුවත් කිරීම

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි , ඔබතුමා විසින් ඉදිරිපත් කරපු යෝජනාව මම ස්ථිර කරන අතරම , මේ සඳහා මම යෝජනා කරනවා. අපේ බල ප්‍රදේශය තුල අපිට මේකට සම්බන්ධ කරගන්න පුළුවන් පුද්ගලයින් ඉන්නවා. විශේෂයෙන්ම උදාහරණයක් විදිහට විශ්‍රාම ගිය විදුහල්පවරුන් බොහෝ දෙනෙක් ඉන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ආපදා කළමනාකරණ කාරක සභාව සඳහා මහරච්චිමුල්ල , කිරිවානාපොල ලිපිනයේ පදිංචි ජේ.බී.හෙට්ටිආරච්චි මහතා සුදුසු යැයි යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි , ඉහත සංශෝධන වලට යටත් එම යෝජනාව මා ස්ථිර කරමි.

ඒ අනුව, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දිම පිණිස සභාවේ සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත ඉහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ආපදා කළමනාකරණ කාරක සභාව පත් කිරිම සහ ඉහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-7-3)** <u>**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/07-3 දරණ යෝජනාව**</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දිම පිණිස සභාවේ සභිකයන්ගෙන් සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව පත් කිරිම සහ පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව**

1. ගරු සභාපති පී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
14. එම්.ඒ.ජී.ජී.ආර්. සමීර රණතුංග මහතා, 471, පිලවතුර, මහරච්චිමුල්ල
15. ආර්.ඒ. උමේෂ් චින්තක ජයසිංහ මහතා, සංවර්ධන නිලධාරී, මලඇලවත්ත, ගලතරය, අලව්ව
16. ඩබ්.ඒ.ජී. වීරසේකර මහතා, ශ්‍රී ලංකා ගුරු සේවය (විශ්‍රාමික), නො. 338/3, දොඩම්කුඹුරවත්ත, අලව්ව
17. ජේ.එච්. කරුණා ජයමහ මහත්මිය, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී, නන්දන, පරමාඋල්ල, අලව්ව.
18. එම්.පී.සී. රේණුකා මහත්මිය, ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව

19. කේ.ඒ.අයි.එස්. කළුආරච්චි මහත්මිය, ප්‍රජා සංවර්ධන නිලධාරී
20. ඩබ්.ඒ.සී.ජේ. වික්‍රමආරච්චි මහත්මිය, සංවර්ධන නිලධාරී (ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ)
21. ජේ.එම්.ඩී. ජයකඩු මහත්මිය, සංවර්ධන නිලධාරී (පරිසර)
22. ස්ථානාධිපති, අලව්ව පොලිස් ස්ථානය
23. ස්ථානාධිපති, බෝයවලාන පොලිස් ස්ථානය
24. ඩබ්.එම්.ඒ.බී. වනසිංහ මහතා, පරිපාලන මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
25. එස්.එන්.එල්.එස්. වික්‍රමසිංහ මහතා, මහජන සෞඛ්‍ය පරීක්ෂක
26. එච්.ටී.ඩබ්. ශ්‍රීනාත් මහතා, පරිසර නිලධාරී, අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල

**සනඅපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවට පැවරී ඇති බලතල -**

1. පළාත් පාලන බල ප්‍රදේශය සඳහා ජලාපවාහන මළාපවාහන කසළ කළමනාකරණය සම්බන්ධ සියළු ආයතන වල සහභාගීත්වයෙන් පොදු සැලැස්මක් සකස් කොට එම සැලැස්ම සියළුම ආයතනවලට හඳුන්වා දී සැලැස්මට අනුව ක්‍රියාකිරීම.
2. කසල කොටස් දෙකකට වෙන් කර (දිරන, නොදිරන ) ලබාගැනිමට වැඩපිළවලක් හඳුන්වා දිම.
3. 3R සංකල්පය භාවිතා කරමින් ජීර්ණය නොවන කසල වන පොලිතින් ප්ලාස්ටික් හා වීදුරු ප්‍රතිචක්‍රීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවලක් සහ ජීර්ණය වන කසල සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම
4. පොදු වෙළඳ පොල තුළ ජනනය වන කසල තෝරා වර්ග කර ගැනීම සඳහා වෙළඳ සංගම් නියෝජිතයින්ගෙන් සැදුම්ලත් කමිටු සකස් කර මහ සභාවට යොමුකිරීම
5. සෞඛ්‍ය කම්කරුවන්ගේ සුභසාධනය හා ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැවීමේ වැඩපිළිවෙලක් සකස් කර මහ සභාවට ඉදිරිපත් කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි , එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව ඉහත සදහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දිම පිණිස සභාවේ සභිකයන්ගෙන් සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත ඉහත නම් සදහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව සඳහා සාමාජිකයින් පත් කිරිම හා ඉහත සඳහන් බලතල පැවරීම ඒකමතිකව සභා සම්මත විය.

**(05-7-4)** **<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/07-4 දරණ යෝජනාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව පහත සදහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දිම පිණිස සභාවේ සභිකයන්ගෙන් සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත පහත නම් සදහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් පුස්තකාල උපදේශන කාරක සභාව පත් කිරිම සහ පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**පුස්තකාල උපදේශක කාරක සභාව**

1. ගරු සභාපති පී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්.පී.ශ්‍රී.ආර්.කේ. සමරනායක මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
7. විහාරාධිපති - මාවතගම සීලානන්ද හිමි,වැරැල්ලගම විහාරය
8. සුනිල් සමරවික්‍රම මහතා,දෙල්ගහමඩම,මහරච්චිමුල්ල
9. ඒ.කේ. දීපාල් අතුකෝරල මහතා,වැත්තෑව ,මහරච්චිමුල්ල
10. එල්.ඩී. ගාමිණී පුෂ්පකුමාර මහතා, මඩවල,කැප්පිටිවලාන

11. ඩබ්.ඒ.ජී. මංජුලා අරුක්ගොඩ මහත්මිය,මල්ලැහැව,කැප්පිටිවලාන
12. ඩබ්.එම්.සී. විජේකෝන් මහත්මිය,බෝයවලාන,කැප්පිටිවලාන
13. ගුණසේකර අධිකාරි මහතා, නාරම්මල පාර,අලව්ව
14. කේ.එම්. සෝමදාස මහතා, නාරම්මල පාර,අලව්ව
15. උමේෂ් ජයසිංහ මහතා,ගලතරය,අලව්ව
16. එස්.එම්.ජී. සන්ධ්‍යා අබේරත්න මහත්මිය, ගල්පොත්තේපොල,අලව්ව
17. එස්.එම්. කාංචනා ප්‍රියදර්ශනී මහත්මිය, විදුහල්පති,කන්දෙගෙදර මහා විද්‍යාලය

<u>පුස්තකාල උපදේශක කාරක සභාවට පැවරී ඇති බලතල -</u>

1. අලව්ව,මහරච්චිමුල්ල සහ බෝයවලාන යන පුස්තකාල තුනෙහි භෞතික සම්පත් සංවර්ධනය සඳහා වැදගත්වන නිර්දේශ මහ සභාව වෙත ඉදිරිපත් කිරීම.
2. ඉහත සඳහන් පුස්තකාලවල පාඨක ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නිර්දේශ සභාව වෙත ඉදිරිපත් කිරීම.
3. පළාත් පාලන සතියට සමගාමීව සංවිධානය කරනු ලබන අන්තර් පුස්තකාල තරග සංවිධානය සඳහා සහාය වීම.
4. පුස්තකාල කාර්ය මණ්ඩලයේ මානව සම්පත් ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නිර්දේශ මහ සභාවට ඉදරිපත් කිරීම.
5. ප්‍රාදේශීය ලේඛකයින්ගේ පොත් පුස්තකාල සඳහා ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි , ඔබතුමා විසින් ඉදිරිපත් කරපු යෝජනාව මම ස්ථිර කරන අතරම, මේ සඳහා මම යෝජනා කරනවා. අපේ බල ප්‍රදේශය තුල අපිට මේකට සම්බන්ධ කරගන්න පුළුවන් පුද්ගලයින් ඉන්නවා. විශේෂයෙන්ම උදාහරණයක් විදිහට විශ්‍රාම ගිය බොහෝ විදුහල්පතිවරුන් ඉන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්දමාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, පුස්තකාල උපදේශක කාරක සභාව සඳහා විශ්‍රාමික පාඨකශාලාචාර්ය මහානාම පතිරණ මහතා සුදුසු යැයි යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, පුස්තකාල උපදේශක කාරක සභාව සඳහා විශ්‍රාමික විදුහල්පති යාපා රාජපක්ෂ මහතා සුදුසු යැයි යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, පුස්තකාල උපදේශක කාරක සභාව සඳහා හිටපු සිංහල ගුරු උපදේශක විශ්‍රාමලත් රණතුංග මහතා සුදුසු යැයි යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මී කාන්ති ඥාණලතා මැතිනිය**
ගරු සභාපතිතුමනි , එම යෝජනා සංශෝධනය යටත්ව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම පිණිස සභාවේ සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත ඉහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් පුස්තකාල උපදේශක කාරක සභාව සඳහා සාමාජිකයින් පත් කිරීම හා ඉහත සඳහන් බලතල පැවරීම ඒකමතිකව සභා සම්මත විය.

**(05-7-5) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/07-5 දරණ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම පිණිස සභාවේ සභිකයන්ගෙන් සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ළමා හා කාන්තා අභිවෘද්ධිය උදෙසා කාරක සභාව පත් කිරීම සහ පහත සඳහන් බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

**ළමා හා කාන්තා අභිවෘද්ධිය උදෙසා කාරක සභාව**

1. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එස්.එම්. යසින්තා සංජීවනී සේනාරත්න මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලවආරච්චි මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
6. ළමා හා කාන්තා කටයුතු නිලධාරී, ළමා හා කාන්තා කටයුතු ඒකකය , අලව්ව පොලිස් ස්ථානය
7. එම්.පී.සී. රේණුකා මහත්මිය, ලේකම් ,අලව්ව ප්‍රාදේශීය සභාව
8. කේ.ඒ.අයි.එස්. කළුආරච්චි මහත්මිය, ප්‍රජා සංවර්ධන නිළධාරී, අලව්ව ප්‍රාදේශීය සභාව
9. වනිතා සංවර්ධන නිලධාරී , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අලව්ව
10. ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අලව්ව
11. ආයුර්වේද වෛද්‍ය නිලධාරිනී , අලව්ව නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව
12. තුෂාර දිසානායක මහතා,පූර්ව ළමා සංවර්ධන නිළධාරී ,අලව්ව ප්‍රාදේශීය සභාව
13. කරුණා ජයමහ මහත්මිය,8 කණුව,පරමාඋල්ල,අලව්ව
14. නදීෂා හේමමාලි මහත්මිය,පඹදෙණිය,අලව්ව
15. එල්.ඩී. ගාමිණී පුෂ්පකුමාර මහතා,මඩවල,කැප්පිටිවලාන

**ළමා හා කාන්තා අභිවෘද්ධිය උදෙසා කාරක සභාවට පැවරී ඇති බලතල -**

1. පළාත් පාලන බල ප්‍රදේශය තුළ ඇති සියලුම ළමා හා කාන්තාවන්ගේ සුරක්ෂිතතාවය සම්බන්ධව ගැටළු නිරීක්ෂණය කිරීම හා ස්වයං විසඳුම් යෝජනා කිරීම.
2. ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා ස්වයං රැකියා වැඩසටහන් සඳහා යෝජනා සකස් කිරීම.
3. ළමා හා කාන්තා හිංසනය පිටුදැකීම උදෙසා කොට්ඨාස මට්ටමින් වැඩසටහන් යෝජනා සකස් කිරීම.
4. පාසල් මට්ටමින් ළමයින්ගේ ආකල්ප සංවර්ධනය කිරීම සඳහා යෝජනා සකස් කිරීම.
5. බල ප්‍රදේශය තුළ හඳුනාගත් ළමා හා කාන්තා හිංසනය සම්බන්ධ ගැටළු සාකච්ඡා කර අදාල ආයතන වෙත දැනුවත් කිරීමට යොමු කිරීම.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**

ගරු සභාපතිතුමනි , එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම පිණිස සභාවේ සභිකයන්ගෙන් සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන්, කොටසක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ළමා හා කාන්තා කාරක සභාව සඳහා ඉහත සඳහන් සාමාජිකයින් පත් කිරීම හා ඉහත සඳහන් බලතල පැවරීම ඒකමතිකව සභා සම්මත විය.

**(05-8) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/08 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 11 (i) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති විසින් එවන ලද අංක NWPLG/KR/B/APS/05/2024/28 හා 2025.05.23

දිනැතිව එවන ලද විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ තත්ත්වාගණනය කළ පහත සඳහන් මතය මහ සභාවට ඉදිරිපත් කරන අතර එය පිළිගැනීම සුදුසු බවට යෝජනා කරමි.

" මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. "

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම විගණන වාර්තා මතය සත්‍ය වාර්තාවක් බවට මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 11 (i) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති විසින් එවන ලද අංක NWPLG/KR/B/APS/05/2024/28 හා 2025.05.23 දිනැතිව එවන ලද විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ තත්ත්වාගණනය කළ පහත සඳහන් මතය මහ සභාවට ඉදිරිපත් කරන අතර එය පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-9) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/09 දරණ යෝජනාව</u>**

ඉඹුල්ගොඩ, අංක 1/45, ලිපිනයේ පදිංචි එන්.එල්. උදයංගනී නීලවතුර යන අය විසින් බදු ගෙන ඇති අලව්ව කඩකාමර අංක 11,අංක 18/ඒ, බෝධිරාජ මාවත, කොළඹ 10 ලිපිනයේ පදිංචි එස්.එච්. බුද්ධික ප්‍රියන්ත ජයකඩු යන අයට පවරා දීමට කැමති බවට ප්‍රකාශ කර දිවුරුම් ප්‍රකාශයක් ලබා දී ඇත. අංක 2019/2 දරණ පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 16 වගන්තිය යටතේ කඩකාමර පවරා දීමට හැකියාව ඇති අතර පහත පරිදි කඩ කාමරයක පවතින මාසික කුලිය මෙන් වාරික 24 ක මුදලක් එකවර ගෙවීමෙන් පසු, මුල් ගිවිසුමේ ඉදිරි කාලය සඳහා ගිවිසුම් ප්‍රකාරව කඩ කාමරය පවරා දීම සුදුසු බවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| මාසික කුලිය | = | රු. 5,750.00 |
| වාරික 24 ක් සඳහා ගාස්තුව | = | රු. 5,750.00 x 24 |
| | = | රු. 138,000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම කඩ කාමර අලෙවි වීමේ ගැටළු තියනවා. මෙම කඩ කාමර කඩලා හදන වෙලාවේ මෙම ගරු සභාවෙන් යෝජනාව සම්මත කරන කොට ඉල්ලීමක් කරා කඩ කාමර කුඩාවට නොවේ. කඩ කාමරයක් අඩුම අඩි 25ක් දිගට , අඩි 20ක් වත් පළල තියෙන කඩකාමර හැදුවොත් අපිට මෙම කඩ කාමර අලෙවි කිරීමේ කිසිදු ගැටළුවක් මතු වෙන්නේ නැහැ. නමුත් ඉදි කිරීම සිදු වුනාට පසුව කඩ කාමර අලෙවි කිරීම කරන්න බැහැ.අවසානයේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ තුන් වෙනි සිහි කැඳවීම මත තමා අපි ලක්ෂ පහ දක්වා මිල අඩු කලාට පස්සේ මෙම කඩ කාමර අලෙවි කලේ. එදා අපි කණ්ඩායමක් හැටියට ගත් තීන්දුව ඔබ තුමා විනිවිදභාවයකින් ගෙනියන්න ඕනා. අද ඇත්තෙන්ම මෙම කඩ කාමරය ගත්ත කෙනාට හොරෙන් අපි විකුනන්නේ නැතිව සභාවට කතා කරලා නිවැරදි ආකාරයට මේ පැවරීම සිදු කල යුතු බවට ප්‍රකාශ කරනවා.

ඒ අනුව ඉඹුල්ගොඩ, අංක 1/45, ලිපිනයේ පදිංචි එන්.එල්. උදයංගනී නීලවතුර යන අය විසින් බදු ගෙන ඇති අලව්ව කඩකාමර අංක 11,අංක 18/ඒ, බෝධිරාජ මාවත, කොළඹ 10 ලිපිනයේ පදිංචි එස්.එච්. බුද්ධික ප්‍රියන්ත ජයකඩු යන අයට පවරා දීමට කැමති බවට ප්‍රකාශ කර දිවුරුම් ප්‍රකාශයක් ලබා දී ඇත. අංක 2019/2 දරණ පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 16

වගන්තිය යටතේ කඩකාමර පවරා දීමට හැකියාව ඇති අතර පහත පරිදි කඩ කාමරයක පවතින මාසික කුලිය මෙන් වාරික 24 ක මුදලක් එකවර ගෙවීමෙන් පසු, මුල් ගිවිසුමේ ඉදිරි කාලය සඳහා ගිවිසුම් ප්‍රකාරව කඩ කාමරය පවරා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-10) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/10 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවේ සතු වත්කම් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවා බදු දීමට අදාලව ටෙන්ඩර් ලේඛනය මේ සමඟ ඉදිරිපත් කරන අතර එම ලේඛනයේ සඳහන් වත්කම් 34 න් අලව්ව සතිපොල හැර 33 (අලව්ව ප්‍රධාන කාර්යාලයේ 23, මහරච්චිමුල්ල උප කාර්යාල බල ප්‍රදේශයේ 03, කැප්පිටිවලාන උප කාර්යාල බල ප්‍රදේශයේ 07) 2026.01.01 දින සිට 2026.12.31 දක්වා කාලයට අදාලව බදු දීම සඳහා 2025.06.16 දින මුදල් කමිටුවේදී ගන්නා ලද පහත නිර්දේශ වලට අනුව ටෙන්ඩර් කැඳවීමට අනුමැතිය ලබා දීමට සුදුසු බවට යෝජනා කරමි.

## වාර්ෂික වත්කම් බදුදීම-2026 වර්ෂයේ වත්කම් ලේඛනය

| අලව්ව ප්‍රධාන කාර්යාලය | | | | | |
|---|---|---|---|---|---|
| අ.අං | වත්කම | 2025 අවම ලංසුව | 2025 වර්ෂයේ බදු ලබාදුන් මුදල | 2026 වර්ෂයේ ලංසුව | මුදල් කමිටු නිර්දේශය |
| 01 | අලව්ව සතිපොළ | 6000000.00 | 6100000.00 | 6600000.00 | 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් නොකිරීමටත් අලව්ව ප්‍රාදේශීය සභාව මගින් සිදු කිරීමටත් |
| 02 | අලව්ව සතිපොල ආපනශාලාව | 138600.00 | 139000.00 | 152460.00 | 2025 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක මුදලක් එකතුකර 2026 වර්ෂයේ අවම ලංසු මුදල තීරණය කිරීමට |
| 03 | අලව්ව සතිපොල පොදු වැසිකිලිය | 26000.00 | 35000.00 | 28600.00 | |
| 04 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 01 | 82500.00 | 83000.00 | 90750.00 | |
| 05 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 02 | 75000.00 | 59865.00 | 82500.00 | |
| 06 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 03 | 75000.00 | 61875.00 | 82500.00 | |
| 07 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 04 | 75000.00 | 50000.00 | 82500.00 | |
| 08 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 05 | 82500.00 | 105000.00 | 90750.00 | |
| 09 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 06 | 82500.00 | 90100.00 | 90750.00 | |
| 10 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 07 | 75000.00 | 62500.00 | 82500.00 | |
| 11 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 08 | 75000.00 | 62500.00 | 82500.00 | |
| 12 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 09 | 75000.00 | 58467.71 | 82500.00 | |
| 13 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 10 | 75000.00 | 50000.00 | 82500.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14 | අලව්ව පොදු වෙළඳපොල එළු මස් කඩය | 228000.00 | | 228000.00 | 2025 වර්ෂයේ අවම ලංසු මුදලම 2026 වර්ෂය අවම ලංසු මුදල ලෙස පිළිගැනීමට |
| 15 | අලව්ව පොදු වෙළඳපොල කුකුල් මස් කඩය | 87260.36 | 87260.36 | 95986.40 | එකවර වසර 3ක් සඳහා වසරකට 10% බැගින් වැඩිවීමේ පදනම මත ටෙන්ඩර් කිරීමට 2026-2028 |
| 16 | අලව්ව පොදු වෙළඳපොල ඌරු මස් කඩය(එකවර වසර 3ක් සඳහා වසරකට 10% බැගින් වැඩිවීමේ පදනම මත ටෙන්ඩර් කිරීම 2026-2028) | 204827.59 | 204827.59 | 225310.35 | |
| 17 | අලව්ව පොදු වෙළඳපොල එළහරක් මස් කඩය මස් කඩය | 1210000.00 | 1210000.00 | 1331000.00 | 2025 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක මුදලක් එකතුකර 2026 වර්ෂයේ අවම ලංසු මුදල තීරණය කිරීමට |
| 18 | අලව්ව බස් නැවතුම්පල පොදු වැසිකිලිය | 99000.00 | 86705.00 | 108900.00 | |
| 19 | අලව්ව දුම්රියපොල පොදු වැසිකිලිය | 59400.00 | 52062.00 | 65340.00 | |
| 20 | අලව්ව නගරයේ මාළු කඩ අංක 01 | 132000.00 | 132100.00 | 145200.00 | පොදු වෙළඳපොළ මාළු කඩ 01,02,03,04 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමේදී අදාල ටෙන්ඩර් කරු විසින් පොදු වෙළඳපොළ තුලම අලෙවි කටයුතු කළයුතු බවත් පෞද්ගලික ස්ථාන වල අලෙවි නොකළ යුතු බවටත් |
| 21 | අලව්ව නගරයේ මාළු කඩ අංක 02 | 132000.00 | 132100.00 | 145200.00 | |
| 22 | අලව්ව නගරයේ මාළු කඩ අංක 03 | 110000.00 | 112000.00 | 121000.00 | |
| 23 | අලව්ව නගරයේ මාළු කඩ අංක 04 | 110000.00 | 384000.00 | 121000.00 | |
| 24 | ගල්වාරම සැනසුම පියස සහා ඉඩමේ පොල් එලදාව | 2640.00 | | 2904.00 | 2025 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක මුදලක් එකතුකර 2026 වර්ෂයේ අවම ලංසු මුදල තීරණය කිරීමට |
| | **කැප්පිටිවලාන උපකාර්යාලය** | | | | |
| 01 | බෝයවලාන සතිපොල භූමියේ මාළු ලැල්ල | 31185.00 | 31500.00 | 34303.50 | 2025 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක මුදලක් එකතුකර 2026 වර්ෂයේ අවම ලංසු මුදල තීරණය කිරීමට |
| 02 | මොරටු කන්ද සුසාන භූමියේ පොල් එලදාව | 24310.00 | 30000.00 | 26741.00 | |
| 03 | ඉඹුල්ගොඩ ගල්කඩුල්ල හේන කැබලි අංක 01 | 2200.00 | 2000.00 | 2420.00 | |
| 04 | බෝයවලාන නගරයේ කුකුල් මස් කඩය | 24200.00 | 24500.00 | 26620.00 | |
| 05 | බෝයවලාන නගරයේ ඌරු මස් කඩය | 11275.00 | | 11275.00 | |
| 06 | මිල්ලගහවත්ත ඉඩමේ සභාව සතු කොටස බදු දිම | | 1100.00 | 1210.00 | |
| 07 | කැප්පිටිවලාන සුසාන භූමියේ පොල් එලදාව | | 3000.00 | 3300.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මහරව්විමුල්ල උපකාර්යාලය | | | | |
| 01 | තිත්තරපොල කොහොල්ලෑපිටිය සභාව සතු ඉඩම | | 6050.00 | 6655.00 | 2025 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක මුදලක් එකතුකර 2026 වර්ෂයේ අවම ලංසු මුදල තීරණය කිරීමට |
| 02 | මහරව්විමුල්ල විල්ගමුව එස්ටේට් වෙන්දෙසි ඉඩමේ සභාව සතු කොටස | | 2200.00 | 2420.00 | |
| .03 | මහරව්විමුල්ල උප කාර්යාල භූමියේ පොල් එලදාව | | 1100.00 | 1210.00 | |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය,**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සතිපොල කාලයක් සභාවෙන් කරේ. ඊට පස්සේ තමා ටෙන්ඩර් කළේ. නමුත් සභාපතිතුමයි මායි නගරයේ ජීවත් වන දෙන්නෙක් නිසා, අපේ සභාවේ සේවක මහතුන් කීපදෙනෙක් යොදවලා ඒ කටයුත්ත කළොත් අපිට ලක්ෂ 80 ක මුදලකට යන්න පුළුවන් වෙයි කියලා විශ්වාසයක් තියනවා. මන් හිතන්නේ ඒ වැඩි මුදල මේ සභාවට ගේන එක තමා මහජන නියෝජිතයින් හැටියට අපේ වගකීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි,අලව්ව සතිපොල ආපන ශාලාව. එතන ආපල ශාලාවට එහා පැත්තේ අපි දුටුවා තාවකාලිකව ඉදිකිරීමක් කරලා තියනවා.ඒක සභාව දැනුවත් කරලා කරනවාද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, ඒක සභාවෙන් කරන ඉදි කිරීමක්. ආපන ශාලාවට ඉඩ මදි නිසා සභාවෙන් ඉල්ලීමක් කරලා , සභාවේ මැදිහත් වීම මත කරලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා. අපි නැවත එතෙන පිළිබඳ විමසීමක් කරමු. ආපන ශාලාවේ ඉඩ ගන්න පුළුවන් හැකියාවක් එතන තව ඉදිරියට අරගන්න තියනවා. එතකොට අපි එතන ආපන ශාලා දෙකක් හෝ තව කඩ කාමරයක් අපට අලෙවි කිරීමට පුළුවන් කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව සතිපොල කුකුල් මස් කඩය , අලව්ව පොදු වෙළඳපොල ඌරු මස් කඩය වසර 3ක් සඳහා බදු දීමට විශේෂයෙන්ම මීට අවුරුදු තුනකට විතර පෙර තීන්දුවක් අපි ගත්තා. ඒක ගන්න හේතුවක් උනේ බොහෝ වෙලාවට, පෙළක් කට්ටිය එනවා. ව්‍යාපාරය අවුරුද්දකට බදු ගන්නවා, මාසයක් හෝ දෙකක් කරලා ව්‍යාපාරය දාලා යනවා. ඊට පස්සේ අපේ RO මහත්වරුන්ට වෙනවා මේ සභාවට ආපු ආදායම් මාර්ග සොයන්න. ඒ සියලු කටයුතු සැලකිල්ලට ගත්තා. ඒවගේම එතුමන්ලා විසින් එයාලගේ වියදමින් කඩ කාමර අළුත්වැඩියා කිරීමේ කටයුත්තට එකඟ වුණා. ඒ අනුව තමයි අපිත් එකඟ වුනේ. කිසිදු සැකයක් නෑ මේ සම්බන්ධව, මෙය විය යුත්තක් සේ සලකනවා.

ගරු සභාපතිතුමනි, මං ඉල්ලීමක් කරනවා, වැසිකිළි පද්ධතිය බදු දෙන්න කලින්, අපේ කාර්මික නිලධාරීන් මහතුන් හරහා ස්ථානීය පරීක්ෂණයක් කරලා , වැසිකිළි පද්ධතිවල තියෙන අඩුපාඩු සියල්ල සකස් කරලා, ඒ කට්ටියට නිවැරදි සෞඛ්‍ය පිළිවෙතකට අනුකූලව ව්‍යාපාරය කරගෙන යන්න අවශ්‍ය පසුබිම සකස් කරලා දෙන්න කියලා.
ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරන්නේ, මේ වැසිකිළි පද්ධතිය බදු ගත්තහම බොහෝ අසතුටුදායක තත්වයට පත්වෙන අවස්ථා තියනවා. ඒ නිසා සභාවේ වගකීම තමා ස්ථාන භාර නිලධාරීන් හා කාර්මික නිලධාරී මහතුන් සම්බන්ධ කරමින් ගරු සභාපතිතුමනි, ලේකම් තුමියනි

ස්ථානීය පරීක්ෂණයක් හරහා නිවැරදි සෞඛ්‍ය මට්ටක කටයුතු කරන්න හැකියාවක් තිබේද කියලා සොයා බලලා මෙහි අඩුපාඩු සකස් කරන්න අවශ්‍ය කටයුතු සිද්ධ කරන වගකීම ඉටු කරන්න කියලා විශේෂ ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි , මේ සම්බන්ධයෙන් වචනයක් කතා කරන්න අවශ්‍යයි. මේ වැසිකිලි දෙකම මනුස්සයින් පාවිච්චි කරන්න බෑ. හරිම දූර්ගන්ධයි. ඒ නිසා ඔබ තුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. මේක නැවත ප්‍රතිසංස්කරණය කරලා බදු ගන්න අයට මේක හරියට පිරිසිදුව පවත්වාගෙන යන්න කියලා උපදෙස් දෙන්න. මොකද අපි ගිහාම රු. 20 හරි රු. 30ක් හරි අය කරනවා. ඒ නිසා ඒක පිරිසිදුව පවත්වාගෙන යන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි , ඇත්තටම මෙම වැසිකිලි පද්ධතිය නිරීක්ෂණය කරන්න මම සම්බන්ධ උනා. එක දවසක් යනකොට වැසිකිලි වල උතුරනවා අපි දැක්කා. ඊට පසු අපි ගලිය දාලා අයින් කලා. හැබැයි එතැන සොයා බැලීමේදී, මෙහෙම ප්‍රශ්නයක් එතැන තියනවා. ඉතාම උල්පත් සහිත තෙත බිමක තමයි ඒ ටැංකිය ඉදි කරලා තියෙන්නේ. ඒනිසා වලට පිටතින් වතුර එකතු වීමක් තියෙන්නේ. මේනිසා නවීන තාක්ෂණයත් එක්ක ටැංකි ඉදි කිරීමට අපි මේ වෙනකොට යෝජනාවක් ගෙනල්ලා තියනවා. ඒ සඳහා තාක්ෂණික අනුමැතිය සහ ඉදි කිරීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් පතලා ලියුමක් ඉදිරිපත් කරලා තියනවා. මේ සැරේ ලක්ෂ 10ක් වෙන් කරලා තියනවා, මස්කඩ පැත්ත ප්‍රතිසංස්කරණය කරන්න. මස් කඩ ටයිල් කරලා සහ අළුත් ටැංකියක් ඉදි කිරීම වගේ කටයුතු කරන්න තියනවා. ඊටපස්සේ ඉහත යෝජනාවටත් අපි මුදල් වෙන් කරලා කරමු.

මෙතෙක් අපේමාළු කඩ හතර ටෙන්ඩර් දීලා ගන්න අය වෙනත් පෞද්ගලික ස්ථානවල තමයි ඒක පවත්වාගෙන යන්නේ. ඉතින් අපි ඇත්තටම සභාවක් විදිහට මහජනතාව වෙනුවෙන් ලක්ෂ ගාණක් වියදම් කරලා මාළු කඩ හතරක් හදලා තියනවා. ඉතින් අපේ අරමුණ බවට පත් වෙන්න ඕනි, අපි විසින් හදලා තියන මාළු කඩ තැනට ඒ බිස්නස් එක අරගෙන එන්න. ඒ නිසා යෝජනාවක් කරනවා මින් ඉදිරියට මේ මාළු කඩ හතර ටෙන්ඩර් එකෙන් ගන්න ඕනම කෙනෙක් අනිවාර්යෙන්ම අපි හදලා තියන සභාවේ මාළු කඩවලම තමන්ගේ ව්‍යාපාරික කටයුත්ත සිද්ධ කරන්න ඕනයි කියන යෝජනාව අපි සම්මත කර ගන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපති තුමනි, ඒ මාළු කඩ ටික තියෙන්නේ මස් කඩේ තියන තැන මාළු කඩ හතර නේද?ස්ටෑන්ඩ් එකට උඩින් තියෙන්නේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රී තුමනි, ඔව්

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එවායේ කවදාවත් විකිණිලා නෑ. එතකොට ඒ කට්ටිය අපෙන් බදු අරන් වෙනත් ස්ථානයක කරගෙනයනවා. එතකොට ඔබ තුමා කියන්නේ ඒක එතෙන්ට ගේන ඕන කියන එකනේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, ඇත්තටම, දැනට පවත්වාගෙන යන තැන සම්බන්ධයෙන් ප්‍රෙද්ශයේ ජනතාවගෙන් විශාල විරෝධයක් එනවා. ඒ තියන ස්ථානයේ මාළු කඩ පවත්වාගෙනයන්න සුදුසු තැනක් නෙමේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඔබ තුමා කතා කරපු නිසා කතා කරනවා. මගේ මතකය යනවා, 2006 වසරට. 2006 වසරේ අලව්ව ප්‍රාදේශීය සභාවට පත්වෙලා ගිහාම.සියලු මන්ත්‍රීවරුන්ගෙන් මංගල යෝජනාව ගානේ ගත්තා. ඒ කාලේ කරුණාරත්න නෝනා තමා මේකේ හිටපු සී.සී. මිස්. මම එතුමියට කතා කරලා ඇහුවා මංගල යෝජනාවක් දෙන්න තියනවා. මොකක්ද සභාවට ගෙනියන්න ඕනි කියලා. එතුමිය කීවා "අපි එහෙමනම් අලව්වේ එක මාළු ලැල්ලයි තියෙන්නේ. තරඟකාරී රටාවක් නෑ.මාළු ලැලි හතරක් ඉදි කිරීම අවශ්‍යයයි. ඒක ඔබතුමාගේ යෝජනාව හැටියට දෙන්න" කීවාහම. සභාවට එක පැත්තකින් බදු මුදල හොයනවා වගේම අපේ ප්‍රෙද්ශයේ පාරිභෝගික ජනතාවට හොඳ මාළු කෑල්ලක් තරඟකාරී මිලකට ගන්න පුළුවන් කියලා. මේ යෝජනාව සම්මත කළාම.සුමිත් කුමාර රාජපක්ෂ මහත්තයා ඒක පිළි අරගෙන එතුමා මාළු ලැලි ඉදි කරන්න සූදානම් කළා. මේ වෙලාවේ ඉල්ලීමක් ආවා ව්‍යාපාරික ප්‍රජාව තැන් තැන්වල හිටියේ. මාළු ලැල්ල ජන රජ මාවතේ තිබුණේ. ඒ දුම්රිය ස්ථානය ආශ්‍රිත තැනක් නැද්ද ? සභාව සතු ඉඩමක් තිබුණා. මේකේ මාළු ලැල්ලක් ඉදි කරන්න යනවා. මේක සිකුරාදට පටන් අරන් සඳුදාට මාළු දාන්න ඉදි කරමු කියලා මන් එතුමාට කීවා. එතුමා මගෙන් ඇහුවා "මම සභාපති ඇයි භය වෙන්නේ. අපි සඳුදා ඉඳන් පටන් ගමු". මම කීවා මේකේ හොර ඔප්පුවලට දෙයියලත් ඉන්නවා. ඒ නිසා කරුණාකරලා ඔබ තුමා සිකුරාදා උදේ පටන් ගන්න සඳුදා උදේ මාළු දැම්මයින් පස්සේ හොර ඔප්පු ලියපු කෙනා උසාවියට ගියත් අපේ ව්‍යාපාරය පටන් අරන් ඉවරයි. නඩුව වැහෙනවා. එතුමා ඒක ඇහුවේ නෑ. මුල්ගල් තිබ්බා. පටන් ගත්තා. හොර ඔප්පු අයිති කෙනා උසාවියට ගියා. අපෙන් යම්කිසි මුදලක් අයකළා. වැඩේ නතර වුණා. එහෙම නතර වුණායින් පස්සේ මාළු ලැලි හතර ටෙන්ඩර් වෙලා ඉවරයි. ඒ කාලේ, එක මාළු ලැල්ලක් තීරණය කළේ ලක්ෂය ගාණේ.මාළු ලැලි හතරටම ලක්ෂ හතරයි. මුදලාලිලා හතරකට ඇවිල්ලා තරගෙට මාළු විකුණන්න කියලා. හැබැයි මේක දිගට හරහට ඇදිලා හැමදාම කවුරු හරි කතා කරලා මේ මාළු ලැලි එක් කෙනෙක් එක් එක් කෙනාගේ නම්වලින් දාලා අරගෙන තමයි මේ ව්‍යාපාරය කළේ.එහෙම ඇවිල්ලා තමයි අවසානයේ ඔබ තුමාගේ මේ ප්‍රශනෙට ඇවිල්ලා තියෙනවා. නාරම්මල පාරේ බරපතල ප්‍රශ්න ගණනාවක් මතුවෙලා තියනවා. ඒක මහජන නියෝජිතයෝ හැටියට නෙවේ පුද්ගලිකව පාරේ යන මනුස්සයෝ අපිට බනිනවා. ඒ නිසා, ගරු සභාපති තුමනි, විශේෂයෙන්මේකඅනුමත කරපු එකේ ඔබ තුමාගේ යෝජනාවක් හැටියට හරි කොන්දේසියකුත් ඇතුළත් කරගන්න කියලා ඉල්ලීමක් කරනවා.

එක් කෙනෙක් මාළු ලැලි හතර නම් හතරකින් ගන්නවා.හතරදෙනාගේ නමින් අරන් එක් කෙනෙක් කරනවා. ටෙන්ඩර් බෝඩ් එකේදී සභාපති තුමා දැකලා තියනවා මාත් එක්ක විවාද කරනවා ඇයි මාළු ලැලි හතරටම එක් කෙනයි නැගිටින්නේ. මේ මාළු ලැලි හතරම එක් කෙනයි අරන් තියෙන්නේ. ඒ නිසා, එහෙම නැතුව විනිවිදබාවයකින් එක් කෙනෙකුට එකේක නම්වලින් දාලා මාළු ලැලි හතර ගන්න බැරිවෙන්න කොන්දේසියක් ඇතුළත් කරලා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රී තුමා,ඇත්තටම අපි ඒකට නෛතිකව පැටලෙනවා. යහපත් චේතනාවෙන් තමයි අදහස එන්නේ.ඉතින් නමුත් ඇත්තටම, හතර දෙනෙක්නේ ටෙන්ඩර් දාන්නේ.එයා හරි කවුරි හරි ඒ පුද්ගලයා මත නෙමේ තීන්දු තීරණ ගන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේකේ අතීතය වුණත් එහෙමයි. දැන් ව්‍යාපාරය කරන ගුණදාස මුදලාලි කරද්දිත් එහෙමයි. මාළු ලැලි හතරම ගුණදාස මුදලාලි නම් හතරකින් ගන්නවා. ඊට පස්සේ, ලොකු මුදලකට ගත්තේ මට ගෙවා ගන්න බැහැ කියලා කතා කරලා කියනවා. ගෙවා ගන්න බැහැ කියලා සභාවේ ලැල්ලට මාළු එන්න පුළුවන්ද? ලැල්ලේ විකුණන්න බැරි මාළු එනවා ඉස්සර වුණෙත් ඕක.

ඒ නිසා, විශේෂයෙන්ම සභාවක් හැටියට සභාවකට අයිති දේපල තියනකොට ඒ දේපල පරිහරණයවිය යුතුයි. අනික එතන එළ හරක් මස්කඩේ, කුකුල් මස් කඩෙත් තියනවා. එතකොට ඒ කට්ටියටත් හොඳ වෙළඳාමක් හැදෙනවා. අවශ්‍ය පහසුකම් ටික සකස් කරලා අපෙන් කඩකාමරය ගන්න කෙනාට කඩ කාමරයේ අඩුපාඩුවක් නොවෙන්න හදලා දෙන්න ඕනි.අපි ඒකට ලොකු වියදමකුත් කරා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, යෝජනාවක් නෙමේ මෙහෙම පොඩි අදහසකුත් තියනවා. අපි ඔක්කොම එකතුවෙලා තව ගැණුම්කරුවෝ වැඩි කරගමු කියලා ඉල්ලීම් කරන්න කියලා. දැන් මේවා හොර රහසේ ඔහේ නිකම්මනේ යන්නේ. ඒ නිසා, තරගයට අදාල උදව්ව අපිත් කරමු. තරගයට කට්ටිය මේක ඉල්ලන්න කියලා තරගයකට පොළඹවන වැඩක් කරමු. අපි හිතන්නේ නෛතිකව ක්‍රියාමාර්ග ගන්න බෑ. ඇත්තටම නම් හතරකින්නේ යන්නේ. පොදුවේ ගත්තොත් හතර දෙනෙක් විදිහට පේන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතමනි, බෝයවලාන නගරයේ ඌරු මස් කඩයක් සහ කුකුල් මස් කඩයත් පවත්වා ගෙන ගියා. එම කුකුල් මස් කඩය පෞද්ගලික කෙනෙක් පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන යනවා. ඒ නිසා සභාවට ආදායමක් අහිමි වෙලා තියනවා. ඒ නිසා ඉදිරියේදී බෝයවලාන නගරයේදී කුකුල් මස් කඩයක් ආරම්භ කරන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපති තුමනි, දැන් මේ ස්ථාන සැනසුම පියස ඉඩම කීවහම අපි දන්නේ නෑනේ. ඒ පිළිබඳව අපිට කියනව නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේ එළදාව පිළිබඳව සභාගත කරනවා. හොයලත් බලනවා. හිටපු ගංගා මන්ත්‍රී තුමිය ගිහාම හිනත් යනවා. පොල් ගස් එකයි. ඒකේ වෙන් කරපු බිම් තීරුවක් තියනවා. ප්‍රජාව එකතු වගා කරනවා. සැනසුම පියස තියෙන්නේ ගල්වාරම කන්ද උඩින් නැගලා පහලට බහින්නේ එතන ගල පැත්තේ වෙන්දේසි ඉඩම.

මේ වත්කම් බදු දීම සම්බන්ධයෙන් ඇත්තෙන්ම මතක ඇති මීට කලින් මේ සභාවට යෝජනා කරලා සම්මත කළා. වත්කම් බදුදීලා තියෙන පෙළක් ඉඩම්වල කිසි දෙයක් නෑ.බදුගත්ත කට්ටියට අපි සභායත් දීලා ඉන්දන්න පොල් පැල ටිකක් අරන් දෙමු. හැබැයි එදා ඒ පොල් පැළ ඉන්දෙවුව නම්, අද පොල් කැඩෙනවා, ඒකත්ඡන්දයෙන් ඒක සම්මත කළා. ඉතින් මේ සැරේ, බහුතරයක් බදු දීමට තියෙන්නේ හිස් එළදාව තියෙන ඉඩම්.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු උප සභාපතිතුමියනි,ගරු මන්ත්‍රීවරුනි, ඒ අනුව, වාර්ෂික වත්කම් බදුදීම - 2026 වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාව සතු සියලු වත්කම් ලේඛනය මේ ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. සභාවේ ගරු මන්ත්‍රී තුමන්ලා තුමියන්ලා සියලුදෙනාගේම ඒකත්ඡන්දයෙන් මෙම වත්කම් බදු දීමේ ලේඛනයට අදාල වත්කම් සහ ඊට ගන්නා වූ සියලු ක්‍රියාමාර්ග සියල්ලම සභා සම්මත වූ බවට මේ වෙලාවේදී ගරු සභාවට ප්‍රකාශ කර සිටිනවා.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ සතු වත්කම් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවා බදු දීමට අදාලව ටෙන්ඩර් ලේඛනය මේ සමඟ ඉදිරිපත් කරන අතර එම ලේඛනයේ සඳහන් වත්කම් 34 න් අලව්ව සතිපොල හැර 33 (අලව්ව ප්‍රධාන කාර්යාලයේ 23, මහරච්චිමුල්ල උප කාර්යාල බල ප්‍රදේශයේ 03, කැප්පිටිවලාන උප කාර්යාල බල ප්‍රදේශයේ 07) 2026.01.01 දින සිට 2026.12.31 දක්වා කාලයට අදාලව බදු දීම සඳහා 2025.06.16 දින මුදල් කමිටුවේදී ගන්නා ලද ඉහත නිර්දේශවලට අනුව ටෙන්ඩර් කැඳවීමට අනුමැතිය ලබා දීමට සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**05-11) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/11 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය සඳහා මහා සභාවේ පූර්ව අනුමැතියකින් තොරව මාසිකව වැටුප් ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය සඳහා මහා සභාවේ පූර්ව අනුමැතියකින් තොරව මාසිකව වැටුප් ගෙවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>යථා පරිදි කල් දී නොමැති යෝජනා</u>**

**05-12) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/02/05/12 දරණ යෝජනාව</u>**

ඓතිහාසික බඹරගල විහාරස්ථානය තුල සිදු කෙරෙන සංවර්ධන කටයුතු සඳහා බඹරගල විහාර මාවතේ පිහිටි පැරණි බෝක්කුව ගලවා ඉවත් කර අලුතින් ඉදි කිරීමට යෝජිත බැවින්, පැරණි බෝක්කුවෙන් ගලවා ඉවත් කරන කලු ගල් සහ ප්‍රයෝජනයට ගත හැකි ඉවත් කරන ද්‍රව්‍ය විහාරස්ථානයේ සංවර්ධනය සඳහා යොදාගැනීම පිණිස ලබා දෙන ලෙස ඓතිහාසික බඹරගල රජමහා විහාරයේ විහාරාධිකාරී පූජ්‍ය මුල්ලේගම සුදස්සි ස්වාමීන් වහන්සේ විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපිය අනුව එමගල් විහාරස්ථානයට ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමනි, මම ඒ පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. වඩුවාව බඹරගල පාරේ දණුක හාඩ්වෙයාර් එක අසල පාලම ඉදි කරනවා. ඒකේ පැරණි පාලමේ තියෙන්නේ ලොකු ගල් කුට්ටි. ඒ ගල් කුට්ටි .මා පන්සල්වල බෝධි ප්‍රාකාර බැම් හදන්න ප්‍රයෝජනයට ගන්නේ. බඹරගල රජ මහා විහාරයේ පොඩි බෝධිප්‍රාකාර බැම්මක් තියෙන්නේ. ඒක හාමුදුරුවන්ගේ අදහසක් තියනවා ඒක විශාල කරන්න. ඉතින් මේ ගල්ටික ප්‍ර යෝජනයට ගන්න තමයි උන්වහන්සේගේ අදහස තියෙන්නේ. ඉතින් ඒ සඳහා අනුමැතිය දෙන්න කියලා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව, ඓතිහාසික බඹරගල විහාරස්ථානය තුල සිදු කෙරෙන සංවර්ධන කටයුතු සඳහා බඹරගල විහාර මාවතේ පිහිටි පැරණි බෝක්කුව ගලවා ඉවත් කර අලුතින් ඉදි කිරීමට යෝජිත බැවින්, පැරණි බෝක්කුවෙන් ගලවා ඉවත් කරන කලු ගල් සහ ප්‍රයෝජනයට ගත හැකි ඉවත් කරන ද්‍රව්‍ය විහාරස්ථානයේ සංවර්ධනය සඳහා යොදාගැනීම පිණිස ලබා දෙන ලෙස ඓතිහාසික බඹරගල රජමහා විහාරයේ විහාරාධිකාරී පූජ්‍ය මුල්ලේගම සුදස්සි ස්වාමීන් වහන්සේ විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපිය අනුව එමගල් විහාරස්ථානයට ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>06.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>**

**(06-1)<u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.06.16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.එය සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.06.16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(06-2)කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.06.17 දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.එය සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.06.17 දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(06-3)නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.06.16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.එය සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.06.16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(06-4) පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.06.17 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාවඉදිරිපත් කර තිබෙනවා.එය සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.06.17 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම</u>**

**(07.1) ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 මැයි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 මැයි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා .

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 මැයි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මතවිය.

**(07.2)ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 මැයි මස ප්‍රාප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 මැයි මස ප්‍රාප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 මැයි මස ප්‍රාප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>**

**<u>08.1 ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා</u>**

ගරු උපසභාපතිතුමියනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා අසනීප තත්වයක් හේතුවෙන්රෝහල් ගතව ප්‍රතිකාර කරනු ලබන බැවින් අද දින මහ සභාවට පැමිණීමට නොහැකි වන බව මා වෙතදැනුම් දුන්නා.ඒ අනුව, අද දින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා හට නිවාඩු අනුමත කිරීම සුදුසුබවට යෝජනා කරමි.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපති තුමනි, ඒ යෝජනාව මම ස්ථිර කරමි.

8.2 .
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි , විශේෂයෙන්ම මේ අවස්ථාවේ අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඡන්දය භාවිතා කරපු ඒ ඡන්දදායකයින්ට ස්තුති කිරීමටයි මේක අවස්ථාව කරගන්නේ. මගේ මතකය හරි නම්, මේ ප්‍රාදේශීය සභාවේ ආරම්භක සභාපතිවරයා සිට මේ දක්වා ආපු සභාපතිවරු හැමෝම එක්ක මම වැඩ කරලා තියනවා. ගාමිණී ගුණදාස මහතා සභාපති වෙනකොට මම වෙළඳ සංගමයේ සභාපති. ඩැනී ගුණසේකර වයඹ කෝටිපතියා තමයි ඒ කාලේ වෙළඳ සංගමයේ සභාපතිවරයා. රණසිංහ මුදලාලි තමයි භාණ්ඩාගාරික හිටියේ. ප්‍රශ්නයක් තිබුණා. ඉඩම් හිමියෝ තමයි වෙළඳ සංගමයේ ධූර දැරුවේ. ගාමිණී ගුණදාස මහතා කීවා අපිට මේක කරන්න වෙන්නෙත් නැහැ. නගර සංවර්ධනය කරන එක වෙන්නෙත් නැහැ. එවගේම මේ කටයුත්තේදී ව්‍යාපාරික ප්‍රජාවට වෙන අසාධාරණය නතර වෙන්නෙත් නැහැ. ඒ ඉල්ලීම මත තමා කඩ හිමියන් වෙනුවෙන්, එදා මං වෙළඳ සංගමයේ සභාපතිවරයා හැටියට පත්වුණේ, මොකද ඉඩම් හිමියන් වෙනුවෙන් නෙවේ, කඩේ ටිකක් සාර්ථක වෙනකොට කඩ හිමියා එළියට දාන්නේ කොහොමද කියන එක වෙනුවෙනුයි. එදා කඩ හිමියෝ වෙනුවෙන් වෙළඳ සංගමයේ සභාපති ධූරයට ඇවිල්ලා ඒ අතරේ අලව්ව විවිධ සේවා සමුපකාර සංගමයේ කාරක සභාවේ සභාපති ධූරයට ගිහිල්ලා .එතනින් අලව්ව ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයකු හැටියට පත් වෙලා , එතනදී චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමයි මායි 2005 ,2006 සිට ආපු මන්ත්‍රීවරුන්. ඒ වගේම අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හැටියට යත්තල්ගොඩ මන්ත්‍රීතුමාලා 1991 ලාබාලතම අපේක්ෂකයා හැටියට

ඇවිල්ලා සභාව නියෝජනය කලා. ආපු ගමන්මග තුල ප්‍රාදේශීය සභාවේ පත්වෙච්ච සියලුම සභාපතිවරුත් එක්ක වැඩ කලා. රාජ්‍ය නිලධාරීන් එක්කත් සුහදව වැඩ කළා. අපි මෙතෙන්ට ආපු හැම වෙලාවකම සභාවේ රැස්වීම් දවසක් වේවා, කමිටුවක වේවා, අපේ බල ප්‍රදේශය වෙනුවෙන්, ඡන්දය පාවිච්චි කරපු ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී හිටපු නිසා මිසක් අපිට පුද්ගලිකව යමක් ලබා ගැනීමේ අරමුණින් නොවේ. විශේෂයෙන්ම ඔබතුමා ගැනත් කියන්න ඕනා ගරු සභාපතිතුමනි , ඔබ තුමාගේ දේශපාලන ප්‍රතිපත්ති 89 ඉදලා ආවා. ප්‍රතිපත්ති වෙනස් කලේ නැහැ. ඒ නිසා අද සභාවේ සභාපති ධූරයේ ඉන්න එක ගැන සතුටු වෙනවා. මොකද ඔබතුමා ඒ පක්ෂයට කරපු කැප කිරීම සහ අපේ පක්ෂවල වගේ මම පුටු අභිමිවීම්වලට හොදට මුහුණ දීලා තියනවා. මං හිතන්නේ, ඒ පක්ෂය විසින් ඔබතුමාට එහෙම දෙයක් වෙන්නේ විදිහක් නෑ. කැප කිරීම් සහ  අසීරුම අවස්ථාවල පවා සිටීම තුළ ඔබතුමා මෙම ධූරයට අද පත්වෙලා ඇවිල්ලා තියනවා.  ඒ කාල පරාසය තුල ඔබ තුමා හිටපු එක හා ඔබේ පක්ෂය ගත්ත තීරණය සහ ඔබතුමා සම්බන්ධයෙන් අද අපි සතුටු වෙනවා. ඒ වගේම ඔබට කියන්න ඕනා අපි පළාත් පාලන මැතිවරණයන්ට ඇතුලත් වෙනකොට, සභාවට සල්ලි දෙන්නෑ කියලා, ගරු ජනාධිපතිතුමා ප්‍රකාශයක් කලා. ඒක මං හිතන්නේ අපේ ප්‍රතිඵලය එන්න ඒක චුට්ටක් බලපාන්න ඇති. ඒක ගරු ඇමතිතුමියත් කරා. විෂයභාර ඇමතිතුමත් කරා, ඒත් ඔබතුමා ඒක කරලා තිබ්බේ නැහැ. ඒ ගැන අපි සතුටු වෙනවා. සභාව ගැන අවබෝධයක් තියන සභාවේ සියලු අණපනත් සම්බන්ධව අවබෝධයක් ලබාගෙන තියෙන කෙනෙක් හැටියට මම දන්නවා. එහෙම කියන්න බැහැ කියලා. මොකද මහජන නියෝජිතයෝ හැටියට අප 13 දෙනෙකුත් විපක්ෂයෙන් මෙතෙනට පත් කරලා තියනවා. මේ චෝදනා මැද්දේ එනකොට, අපිට තිබුණු ඊලග ප්‍රශ්නේ තමා ගරු සභාපතිතුමනි, ස්වාධීනව ආවත් පිළිගත් දේශපාලන පක්ෂෙකින් ආවත් මේ ඉන්නේ හොරු කියන චෝදනාව. ඒක ඔබතුමා කරයි කියලා කියන්නේ නෑ. Facebook එකෙත් කරා. ප්‍රසිද්ධියෙත් කරා. ප්‍රසිද්ධ වේදිකාවලත් කරා. මම ප්‍රාදේශීය සභාවට මේ සැරේ ඉල්ලන්න නෙවේ හිටියේ. ඒකට එක හේතුවක් තිබුණා. යම්කිසි දේශපාලන කළකිරීමකුත් තිබුණා. ඒ වගේම මගේ අම්මා වැටිලා ගෙදර , නෝනගේ තාත්තා වැටිලා අනෙක් පැත්තෙන් ගෙදර, ලෙඩ්ඩු දෙන්නෙකුත් එක්ක තමා ඡන්දය කරන්න තිබුණේ. අවසානයේ තලතා අතුකෝරල තුමිය කතා කරලා කීවා,  මේක අත්සන් නොකර ඉන්න එපා. අත්සන් කරන්න. ගෙදර හිටියත් කමක් නැහැ, අපි කණ්ඩායමක් විදිහට ඉදිරිපත් වෙන්න ඕනි කියලා. එතනදී විශේෂයෙන්ම ප්‍රශ්න සියල්ල දරාගෙන මේ මැතිවරණයට ආපුවාම. ගරු සභාපතිතුමනි,  ඊලග සතුටුදායක කාරණේ තමා. ඕස්ට්‍රේලියාවේ ඉන්නවා මගේ ඥාතියෙක් .ඥාතීත්වයට මගේ බාප්පා. අල්ලපු වැටේ පදිංචි. එතුමා තමා මේ ඡන්දයට අවශ්‍ය කරන පහසුකම් ලබා දුන්නේ. ඒ නිසා Facebook හරහා “ඥාතීත්වය කියාගෙන එයි, හිතවත්කම් කියාගෙන එයි, ගමේ ජනප්‍රිය පුද්ගලයා කියාගෙන එයි. ඡන්දය දෙන්න එපා මේ වෙලාවේ” කියලා දැම්මා. .ඥාතීත්වයේ සහයෝගයත් එක්ක පළාත් පාලන මැතිවරණයට තරග වැදුනම වෙන් වෙන් වශයෙන් අප සියලු දෙනාටම මොන මොන බාධක ආවත් අපි 13 දෙනා මේ සභාවට පත්වෙලා ආවා. ඔබතුමන්ලාගෙන් 13ක් එනකොට අපෙත් 13ක් ආවා. අද නවක මන්ත්‍රීවරුනුත්, පරණ මන්ත්‍රීවරුනුත්  හැටියට අපි කට්ටිය එකතු වෙලා, සාකච්ජාවෙන් , සම්මුතියෙන් මේ බල ප්‍රදේශයේ 72000 ක් වූ ජනතාවගේ සිතුම් පැතුම් ඉටු කරන්න කැප වීමකින් කටයුතු කරන්න අවස්ථාව අපිට උදා වෙනවා. ඒ කටයුත්ත උදා කර ගන්න අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ , අලව්ව උතුර දකුණ වසම් දෙකේ ඡන්ද පමණක් නෙවේ මන් සලකන්නේ සියලු දේශපාලන පක්ෂවලට ඡන්දය  පාවිච්චි කරපු පිරිස  බොහෝ බුද්ධිමත්ව ඡන්දය පාවිච්චි කලා මහජන නියෝජිතයින් පිරිසක් පත් කරලා යවන්න ඕනි අපේ කටයුතු කරගන්න කියලා. ඒ වගේම රජය ලොකු මුදලක් දරලා ඡන්ද පත්‍රිකා සියල්ල මුද්‍රණය කරලා ඡන්ද කාඩ් සියලු ගෙවල්වලට එව්ලා. ලොකු වියදම් කරද්දිඅ, ඔබ තුමාට කියන්න දුකයි, අලව්ව උතුරු දකුණ වසම් දෙකේ විතරක් ඡන්දදායකයෝ 2000 කට ආසන්න සංඛ්‍යාවත් ඡන්දය පාවිච්චි කරන්න ගියේ නැහැ. එක පුද්ගලයෙන් වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරන්න රජය විශාල මුදලක් දරනවා. තමන්ගේ ඡන්දය කැමති පක්ෂයකට අඩුම ගානේ දාන්න ගියා නම් නම් මීට වැඩිය තවත් ප්‍රජාතන්ත්‍රවාදීව ජන සම්මතවාදීව හොඳ මහජන නියෝජිතයින් පිරිසක් මෙතනින් තේරිලා එනවා. හැබැයි රජය විසින් වියදම් කරලා , මහන්සි වෙලා කටයුතු කරලා, අවසාන මෙහොතේ තමා ඡන්දෙ දවසේ උදේ ගෙදරට ගිහිල්ලා ඡන්දය භාවිතා කරන්න කියලා කියන ඡන්දදායකයින් පිරිසක් තමා අද බහුතරයක් ඉන්නේ. ඒ පිළිබඳව අද පොඩි කණගාටුවක් තියනවා. විශේෂයෙන්ම මහජන නියෝජිතයෙක් හැටියට මන්ත්‍රී මණ්ඩලයේ විපක්ෂයේ 13 දෙනාම මේ සභාවට ගෙන එන්න ඒ කැපවීම් කරපු ඒ සියලු දෙනාටත් , මේක අවස්ථාවක් කරගන්නවා ස්තුති කරන්න. ඒ වගේම ගරු සභාපතිතුමනි , අපි 13 දෙනාම පත් කරලා එව්වේ විපක්ෂයක් හැටියට, ඔබත් එකතු වෙලා මේ බල ප්‍රදේශය තුළ පවතින සියලුම

සුභවාදී කටයුතුවලට සහයෝගය දීලා මේ කටයුත්ත කරගෙන යන්න. ඒ කටයුත්තතේදී මේ සභාවේ ගෞරවය හා අභිමානය සුරැකෙන ආකාරයට සියලු දෙනාගේම අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරමින් ඡන්දය පාවිච්චි කරපු සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් මගේ කතාව අවසන් කරනවා. සියලු දෙනාටම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මට ලිපියක් ලැබුණා, ඒක කියවන්න අවසරයි. කිරිවානාපොල සායන මධ්‍යස්ථානය හා මාතෘ හා ළමා සායනයේ අඩුපාඩු සම්බන්ධවයි.
කිරිවානාපොල , මහරච්චිමුල්ල මාතෘ හා ළමා සායනයේ හඳුනා ගැනීමේ පුවරුව දිරාපත් වී ඇත. දැනට එම පුවරුව නොමැති වීම නිසා එම ප්‍රදේශය නම් කර සකස් කර ගැනීමටත් , සායනයේ ඉදිරිපස හට් එකක් වගේ ඉදි කරලා දෙන්න කියලා තමයි ඉල්ලීම කරලා තියෙන්නේ. මෙතෙක් මේ ගොඩනැගිල්ලේ ලයිට් බිල ප්‍රාදේශීය සභාව තමයි ගෙවන්නේ. මට මතක විදිහට, මේක හදන්න ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමා ලක්ෂ 40ක් දුන්නා. ඊට පස්සේ කට විදුලිය ලබා දීමටත්, ජනෙල්වලට වීදුරු දාලා ජනෙල් සකස් කිරීමත් කළේ පළාත් සභාවෙන්මයි. මම හිතන්නේ දැන් ප්‍රාදේශීය සභාවට අයිති ඇති. නැත්නම් ලයිට් බිල් ගෙවන්නේ නැනේ. මම දන්නේ නැ හරියටම ඒක ගැන. එතකොට ඒකේ දෙමහල් ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ තමයි රැස්වීම් ශාලාව තියෙන්නේ. රැස්වීම් ශාලාවේ සමිති සමාගම් තියනවා. පහළ මාලයේ තමයි මාතෘ හා ළමා සායන ඔක්කොම තියෙන්නේ. මම හිතන්නේ, මාසෙකට හය වතාවක්ම සායන තියනවා. මේකට ආවහම මාතෘ අයනම් ඇතුලට ගන්නවා නමුත් ළමයින්ගේ සෝසාව නිසා, ළමයිනුත් එක්ක ඉන්න කට්ටිය ඇතුළට ගන් නැහැ. හිටපු ගරු සභාපති තුමා සන්ධ්‍යා කුමාර මැතිතුමා ඉදි කරපු වේදිකාවක් තියනවා. ඒ වේදිකාවෙත් සමහර වෙලාවට ඉන්නවා. නිලධාරී මණ්ඩලයේ කාර්යාල ගොඩනැගිල්ලෙත් ඉන්නවා. මේ ඉල්ලීම පිළිබඳව සලකා බලමින් සහ පියස්සක් වගේ හෝ අපිට වැස්සට ඉන්න එහෙම තැනක් සකස් කරලා දෙන එක සුදුසුයි කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, වෙනත් කරුණු යටතේ පොඩි ස්තූතියක් කරන්න ඕනා. ඒකයි මම මේඅවස්ථාව ගත්තේ. අපේ ප්‍රදේශය ගත්තහම ඇත්තටම වීථි පහන් සවි කිරීම සම්බන්ධව හැමදාම මං මොනම ආකාරයෙන් හරි මේ කාල පරාසය ඇතුලේ වීථි පහන් නඩත්තුව කරගෙන ගියා. ඒවා නිවෙන්න දුන්නේ නැ. යාංගල්මෝදර ඉදලා ඇතුලට ගියාම සමහර විට යාංගල්මෝදර ඉදලා අලච්ච දක්වා වීථි පහන් ටික සමහර අවස්ථාවල දැල්වෙන්නේ නැහැ. ඒ උනත් බොහොම කැප වීමෙන් යුක්තව මගේ බල ප්‍රදේශයේ වසම් 5ක් ඇතුලේ වීථි පහන් හැමදාම දැල්උනා. මිනිස්සුන්ට ඒ අවශ්‍ය පහසුව දෙන්න කැප වීමෙන් කටයුතු කලා. ඊට පස්සේ දේශපාලන පෙරලියත් එක්ක මාස නවයක් වීථි පහන් නිවෙන ඒවා පත්තු උනේ නැ. ඒවා ටික දැල්වෙන්නේ නැතිව යාංගල්මෝදර හංදියේ සැහෙන පිරිසක් රෑට ඉන්නවා. එතැන වීථි පහන් එකයි දැල්වුනේ. වීථි පහන් දෙකක් දැල්වෙන්නේ නැතිව තිබුණා. ඒවාගේම රේල්වේ ක්‍රොසින් එක හරහා යන මාර්ගයේ අනතුරු සිද්ධ වෙන තැනක්. බොහෝ බයිසිකල් දාන්න බැහැ පෙරලෙනවා. එතැන වීථි පහන් තුනක් තිබුණා. ඒ තුන දැල්වෙන්නේ නැතිව තිබුනේ. හැබැයි ඊයේ සහ පෙරේදා වීථි පහන් ටික අළුත්වැඩියා කරලා. ඒ ප්‍රදේශය ඒකාලෝක කරලා තියනවා. ඉතින් ඒක දැකපු මා හට සංතෝෂයි. ඉතින් ඒ පිළිබඳව ප්‍රාදේශීය සභාවේ ප්‍රධානියා හැටියට ඔබ තුමාටත් , ඒ කොට්ඨාශයේ අපේ ප්‍රියන්ත මන්ත්‍රී තුමාටත් අපේ ස්තූතිය පුද කරනවා. ඒ වගේම අපේ හඟවත්ත සමිති ශාලාව ඉස්සරහ වීථි පහනක් අවුරුදු එක හමාරකින් පමණ අපිට හයි කරන්න බැරිව හිටියේ. ඒ වගේම තවත් ස්ථානයක් තිබුණා, එතනත් අලුතෙන්ම වීථි පහන් සවිකරලා ඒකාලෝක කරලා තියනවා. එතන පිරිත් කියනවා. උත්සව අවස්ථාවත් තියනවා. ඒක එතුමා අලුතෙන්ම වීථි පහන් දෙකක් සවි කරලා ඒ කාර්යයත් ඉෂ්ඨ කරලා තියනවා. ඉතින් ඒ පිලිබඳව ඔබතුමාට සහ එතුමාට ස්තුතිය පල කරනවා. ඔබතුමා මේ ප්‍රාදේශීය සභාවේ ඉදලා මේ ක්‍රියාවලිය පිළිබඳව හොඳට දන්න කෙනෙක් හැටියට, මේ මන්ත්‍රීවරු සියලු දෙනාටම ගියපාර අපි වීථි පහන් හදන්න කාල සටහනක් හදලා දින වෙන් කරලා දීලා තිබ්බා . ඒ වෙලාවේ සභාපතිවරයාට දහයක් පමණ වෙන් කර ගත්තා. අඛණ්ඩව ඇත්තටම ඒ ඉල්ලීම් එනකොට , ඒ ප්‍රදේශයේ අභවල්ලු කියලා නැ, ඒ ප්‍රදේශයේ සභාපතිවරයා හැටියට යම් යෝජනාවක් ආවොත් ඒක කඩිනමින් හදන්න ඔබ තුමාට ඒක තියෙන්න ඕනා. දින දහයක් මාසෙකට විතර කියලා ඉතුරු දින ටික මන්ත්‍රීවරුන්ට කඩලා වෙන් කරලා දුන්නා. ඔබතුමා දන්නවා ඒක. මේ දිනවල අභවල් මන්ත්‍රීවරයා කියලා නැ මේ සියලු දෙනාටම දීලා තිබ්බා. ඉතින් මේ ක්‍රමවේදය ඔබතුමා අනුගමනය කරනවාද? කියලා මට දැන ගන්න ඕනා ගරු සභාපතිතුමනි. ඒ හැමකෙනෙකුටම

ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ පුටුවේ ඇවිත් ඉඳගත්තහම , ඒ ප්‍රදේශයේ වීථි පහනක් දැල්වෙන්නේ නෑ කියලා කියපුවම ඒ මන්ත්‍රීවරයාට ඒ වීථි පහනක් හදා ගන්න බැරිනම් එතැනදීම ඒ මන්ත්‍රීවරයාගේ මන්ත්‍රීධූරයේ තියෙන ගෞරවනි භාවය පිළිබඳව යම් යම් ගැටළු ඇති වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබ තුමා හොඳ මන්ත්‍රීවරයෙක් හැටියට හිටපු කෙනෙක් හැටියට සභාපතිවරයාත් එක්කත් හිටපු කෙනෙක් හැටියට මේ ප්‍රශ්න සියල්ල පිළිබඳ අවබෝධයෙන් දකින කෙනෙක් හැටියට මා විශ්වාස කරනවා. ඉතාම කඩිනමින් මේ පිළිබඳ වැඩසටහනක් හදලා අනිත් අයටත් ඒ අවස්ථාව දීලා මේ මන්ත්‍රීවරු හැම කෙනාටම බෙදිලා යන ආකාරයට හරි ජේෂ්ඨත්වය අනුව හෝ ඔබ තුමාගේ පක්ෂයේ ඉන්න දහතුන්දෙනාට ප්‍රථමයෙන් දීලා හරි ඒක ඔබ තුමාට සුදුසුයි කියලා හිතෙන ආකාරයකට ක්‍රියාත්මක කරලා, අනිත් අයටත් අවස්ථාවක් දෙන්න කියලා ගෞරවනීය ඉල්ලීමක් ඔබතුමාට කරනවා. ඊට වැඩියේ කතා කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට තිබුණේ මෙම කරුණු දෙක තමා කතා කරන්න. වීථි පහන් සවිකිරීම සම්බන්ධව නැවත වතාවක් ඔබ තුමාට සහ කොට්ඨාශයේ මන්ත්‍රීතුමාට ගෞරවනීය ස්තූතිය පල කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.යූ. චමින්ද මාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, වෙනත් කරුණු යටතේ වීථි පහන් ගැන කතා කරපු නිසා අද , මටත් කතා කරන්න දෙයක් තියනවා. අපේ ගරු සාපතිතුමා හා ගරු මන්ත්‍රීතුමාව ඇගයීම් පිළිබඳ ගොඩක් ස්තූතියි. ඒ වගේම නිරතුරුව සහයෝගයෙන් මේක අපි එක්ව යන්න යන්න ඕනා ගමනක්. මම හිතන්නේ ඔබ තුමන්ලා ජොෂ්ඨ මන්ත්‍රීවරු හැටියට ඔබ තුමාන්ලාගේ සහයෝග,ය අදහස් ගරුකොට පිළිගන්නවා. ඒවගේම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් එක යෝජනාවක් විදිහට කරනවා. කොට්ඨාශ මාරු වෙන විදිහට, අපි විදුලි පහන් දාලා තියනවා. එක විදුලි පහන් කණුවක් අසල ඉන්න නිවසකට උදේ කාලයේ හෝ රාත්‍රී කාලයේ දල්වලා ආපසු නිවන්න කියන එක අපිට පුලුවන් නම් දැනුවත් කරන්න ඒක හොඳ කාරණාවක් වේවි. අපි දැකලා තියනවා වැඩ කරන කොට සමහර තැන්වල දහවල් දොළහ වෙනකොටත් දැල්වෙනවා. ඒ පිච්චෙන්නේ අපේ රටේ බල ශක්තිය .ඒ සඳහා අපේ යෝජනාවක් විදිහට මම කියන්නේ, ගරු මන්ත්‍රීතුමන්ලා මැදිහත් වෙලා ඒ විදුලි පහන් දාලා තියෙන තමන්ගේ කොට්ඨාශයේ ළඟ නිවසක් හෝ කවුරු හෝ ගෙවල් එකක් දෙකක් යෝජනා කරලා අදාල කාලසීමාවේ මේ විදුලි පහන් උදේට නිවලා දාන්න හවසට පත්තු කරන්න ඔවුන් පොඩි දැනුවත් කිරීමක් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවිර මැතිනිය**
ගරු සභාපතිතුමනි, ගොඩක් දවසකින් පසුගියදාක මම වැත්තෑව මාවතේ රාජකාරිය සඳහා ගමන් ගත්තේ,ඒ මොහොතේ කන්ද පහුකරලා ගොඩක් දුරට යනකල් වීථි ලාම්පුවක් දැල්වෙන තැනක් දැක්කේ නැහැ. මම ත්‍රීවිල් එකේ මල්ලීගෙන් ඇහුවා හැමදාමත් මෙහෙමද තිබ්බේ කියලා. මටම ලැජ්ජයි. ඉතින් මම හිතනවා, එතන කන්ද, එතනින්පල්ලමේ වංගුව, අතීත තැන් තියෙන්නේ ඒ නිසා කාගේ මාර්ගයෙන් උනත් කමක් නැහැ. සමහර විට බල්බ් පත්තු වෙන්නේ නැතිවෙන්නත් පුලුවන් කාර්මිකශිල්පී මහතා යොදවලා හරි ඒකට ඉක්මනින්ම අවධනාය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි , උප සභාපතිතුමියනි සියලු දෙනාගෙන්ම අවසරයි, කරුණු දෙකක් තියනවා. එකක් තමයි අපේ නවතල්වත්ත ග්‍රාමීය රෝහල . රෝහලේ ගිලන් රථයක් තිබුනා. ඒ ගිලන් රථය අලව්වේ රෝහලේ ආපදාවට ලක්වෙලා ඉතින් ඒ වෙනුවෙන් ගත්තා. දැන් ඒක හදලා නැවත අපිට ගිලන් රථය භාර දෙනවා. හැබැයි ඒ ගිලන් රථය මෙහෙට ගේනකොටම හිටපු රියදුරු මහතා ස්ථානමාරු කරා. අලව්ව හිටපු කෙනා විශ්‍රාම ගත්තා. දැන් මේ ගිලන් රථය අපිට ලැබුනට මේක තියාගන්න බැරි වෙනවා. අපේ රියදුරු මහතෙක් එතැන නැති නිසා. එතකොට ඔය ප්‍රශ්නේ දිගට කතා කෙරුවා සිසිර මන්ත්‍රීතුමත් කතා කෙරුවා. මම හිතන්නේ සංවර්ධන කමිටුවට නම් එදා අපි ගියේ නෑ. කතා කරන්න බැරි උන අදාල පුද්ගලයා හිටියේ නෑ. දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා ඇවිල්ලා හිටියේ නෑ. එතකොට මේකට අපිට මොකක්ද කරන්න පුලුවන්. හැකි ඉක්මනින් රියදුරු මහතෙක් ඕනා. මේ ග්‍රාමීය රෝහලෙන් ග්‍රාම සේවක වසම් 18ක් ආවරණය වෙනවා. එතකොට සාමාන්‍යයෙන් 36000කට විතර මේකෙන් සේවය සැපයෙනවා.. එතකොට එතෙන්ට ගිලන් රථය හරි වැදගත්. අනික් ඉස්පිරිතාලවලටත් අවශ්‍ය වේලාවට කැඳවලා ගන්නවා. නමුත් ඒක එතැන තියෙන්න ඕන නිසා ඒක රෝහලට වෙන්වෙලා ආපසු ඒක

රක ගන්න උවමනාවක් තියනවා. මට ඒක අතුරු කතා කාලයේ කතා කරලා යන්න පුළුවන් ප්‍රතිපාදන කොච්චර තියනවද කියලා මම දන්නේ නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි අපිට ආපසු ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට සැහෙන්න කාලයක් ගත වෙනවා . නැත්නම් ඇත්තටම එතැන අදාල නිලධාරීන් ඔක්කොම හින්දා කතා කරලා විසදගන්නත් තිබුනා. දැන් ඒකට කාලයක් ගත වෙනවානේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එතකොට ඊලග කරුණ මගේ කොට්ඨාශයේ කොන ගල්දෙණිය, කෙටේවත්ත මංකඩ කියලා එකක් ගල්දෙනියේ තියනවා. ඒක තියෙන්නේ හයිවේ එකේ. මා ඔය හරහා උඩින් යන පාළම. ඒක කට්ටියගේ වැඩ සදහා මේකේ යට තාවකාලික පාරක් හැදුවා. නමුත් ගල්දෙණිය ජනතාවට මිරිගම සම්බන්ධ විමට, බස්නාහිර පළාත් සම්බන්ධ වීමට ඒක ගොඩක් පිටුවහල් උනා. දැන් එතන කඩාගෙන ගිහිල්ලා, ඒ පාරවල් දෙක දෙපැත්තෙන් තියනවා මැද කඩාගෙන ගිහිල්ලා. එතකොට ගල්දෙණියේ ඉන්න කෙනෙක් මිරිගමට ගිහිල්ලා යන්න ඕනැ නම් නැත්තනම් ගිරිඋල්ලට ගිහින් යන්න ඕනා. එහෙම නැත්නම් නවතල්වත්තට ඇවිල්ලා මිරිගම පාර බලා යන්න ඕනා. ඒ කට්ටියට ඒක ලොකු එකක්. අනික කෙටේවත්ත මංකඩේ ඓතිහාසික දේවාලයක් තියනවා. ඒකට මම කියන්නේ, බැම්මක් අපිට කාරක සභාවේ To ලා හරහා කියලා බැරිවෙයිද මෙකෙන් පිටුවහලක් මොනව හරි කරන්න පුළුවන් නම් කෙටේවත්ත මංකඩ ආපසු සම්බන්ධ කරන්න ඒක ලොකු හොද දෙයක් නේද, අපේ නාරද මන්ත්‍රීතුමා. මම හිතන්නේ නාරද මන්ත්‍රී තුමත් දන්නවා ඒක හොද තැනක් කියලා. ඒ නිසා අපිට ඒක පුළුවන් නම් ඒකටත් මොනවා හරි ඔබ තුමාලාගේ අවධානය යොමු කරලා දෙයක් දෙන්න කියලා ඉල්ලා සිටිනවා. නැවතත් සියලු දෙනාටම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එතුමා ගෙනාපු යෝජනාව ග්‍රාමීය රෝහලක් සම්බන්ධව, මිනිස් ජීවිත සම්බන්ධව තියෙන ගැටළුවක්. මම ඔබ තුමාට කියනවා ඔබ තුමාගේ බලය පාවිච්චි කරලා ඔබතුමා බඹරගල පන්සල සම්බන්ධව ඉස්සෙල්ලා ගත්තා වගේ විශේෂ යෝජනාවක් හැටියට මේක සභාවට ඇතුලත් කරලා. ඒ අදාල ආයතනවලට සභාවේ ඒකමතිකව සම්මතයක් හැටියට සම්මත වුනා කියලා. මේ හරහා දැනුවත් කරන්න කියලා ඔබතුමාට කියනවා. ඔබ තුමාගේ බලතල අනුව තමයි තීරණය කිරීමේ බලය තියෙන්නේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමාන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ඇත්තටම අපි වෙනත් කරුණු යටතේ කතා කරන්නේ. දැන් කමක් නැහැ. අපි හුරුවෙමු . අනිවාර්යෙන්ම ඊනිම යෝජනාවක් අපිට කලින් දාන්න. අපි සභාවේ ඒවා කතා කරමු. ප්‍රශ්නයක් නැ යෝජනා දෙන්න. නැතිනම් වෙනත් කරුණු යටතේ හුරුඋනොත් මේ මන්ත්‍රීවරු 25 දෙනාම යෝජනා අරන් එන්න පුරුදු වෙනවා. එතකොට අපිට හත අට වෙනකල් ඉන්න වෙනවා. අපි යෝජනා යෝජනා විදිහටම ගේමු. ඒ නිසා පොඩි කාරණා ටිකකට මේක තියා ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගිලන් රථය සම්බන්ධයෙන් මේ ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයෙක් හැටියට වචනයක් කතා කරන්න ඕනා. මේ ගිලන් රථය බොහොම වටිනා ගිලන් රථයක්. මේක යෝජනාවක් හැටියට හදලා ඉදිරිපත් කරන්න. මොකද අපේ ප්‍රදේශය බොහොම ග්‍රාමීයයි. හදිසියකට රෝහලකට එන්න කීවොත් අලව්ව රෝහලට එන්නත් සාමාන්‍යයෙන් විනාඩි 15-20ක් අතර කාලයක් යනවා. හැබැයි තල්වත්තට අපිට විනාඩි 5-10 ත් අතර යන්න පුලුවන්. එහෙම ගියාම අපිට අවශ්‍ය මූලික ප්‍රතිකාර ටික කරලා වහාම ඒ රෝගියාව දඹදෙණිය මූලික රෝහලට හරි කුරුණෑගල රෝහලට යවන්න හරි ගිලන් රථයක් අත්‍යවශ්‍යයි. ඒ නිසා මේ ගිලන් රථය සැහෙන කාලයක් පැවතුනා. මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් බේරුණා. ඒ නිසා ඉදිරියටත් ඒ අවශ්‍යතාවය ප්‍රදේශයේ ජනතාවට පහසුකම් ලබා ගන්නට මේ සම්බන්ධව විධිමත් වැඩපිළිවලක් ඔබතුමා සකස් කරන්න. ගිලන්රථය තියනවා. ඒ නිසා රියදුරෙක් විතරයි අවශ්‍ය. ඒ නිසා රියදුරා ලබා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි, කලින් මට අතපසු වුනා මස් හා මාළු කඩ බදු දීම සම්බන්ධව කතා කරන කොට, අලව්ව සතිපොළෙහි පැවැත්වෙන මස් කඩ සම්බන්ධව. පෙරේදා මස් කඩයක් , දෙකක්

තිබුනා. මාලු කඩයක් කෙරවලේ තිබුනා. මැද නම් මොනවත් තිබුනේ නැහැ. හැබැයි මෙවායින් මහජනතාවට මස් ටිකක් ගන්න පුළුවන් . ඒ නිසා ඒකේ සුරක්ෂිතභාවයක් නැහැ. ඒ ගැන අපිට වග කියන්න කෙනෙක් නැහැ, පිරිසිදුද , හොදද කියලා. මම විදේශවලදි දැකලා තියනවා මේ හැම මස් කෑල්ලකටම සීල් එකක් ගහලා ප්‍රමිතියට අනුව කමයි මස් දෙන්නේ. හැබැයි මෙතැන මොකුත් නැහැ .නිල මැස්සෝ පිරිලා. අපි අහලා තියනවා,මැස්සන්ගෙන් තමයි වෛරස් බෝවෙන්නේ, විෂබීජ එන්නේ කියලා. හැබැයි ඒ මස්වල හිටියේ නිල මැස්සෝ සාමාන්‍ය මැස්සොත් නෙමේ. ඒ නිසා කාරුණාකරලා පාරිභෝගිකයන්ට දෙනවිට ඒක විධිමත් විදිහට සකස් කරලා පාරිභෝජනයට ගන්න පුළුවන් ආකාරයට ඒ ප්‍රමාණය ලබා දෙන්න කියලා ඉල්ලීම කරනවා. පොඩි ස්තුතියක් කරන්න තියනවා. ඔබ තුමාටත් ලේකම් තුමියටත්, අපි ගිය පාර විශේෂ සභාවට එනකොට මේ ස්ථානයේ තිබුණේ සාමාන්‍යයන් ටියුෂන් පන්තිවල තිබෙන ඩෙස් බංකු තමයි. ඒක ඉවත් කරලා මේකේ පොතක් ෆයිල් එකක් තියාගන්න පුළුවන් ආකාරයට ඩෙස් ටික සකස් කිරීම සම්බන්ධව ඔබතුමන්ලාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම චමින්ද මන්ත්‍රී තුමා කීවා වගේ අපට අනාගතයේ වර්තමානයේත් බලපාන ලොකු ප්‍රශ්නයක් තමා වීථි ලාම්පු ප්‍රශ්නය. අපි ඉතිහාසයේ කරා වගේ මන්ත්‍රීවරු 26 දෙනාටම වීථි පහන් සම්බන්ධයෙන් යම්කිසි හොඳ වැඩපිළිවෙලක් හදමු. විශේෂයෙන් අපිට ගමට ගිහාම කියයි වීථි ලාම්පුව පත්තු වෙන් නෑ කියලා. ඒ නිසා මම කියනවා ඔබ තුමාටත්, ලේකම් තුමියටත් සියලු දෙනා මැදිහත් වෙලා 26 දෙනාට මාසයකට දවසක් හෝ දිනයක් ලබා දීලා අක්‍රීය වෙලා තියෙන වීථි ලාම්පු විශේෂයෙන් සක්‍රීය කරගන්නත්. ඒ වගේම,මහන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රථම අපි 26 දෙනාම එන කොට ඔක්කොම අපේ ආදරණීය ජනතාව ඉල්ලීමක් කරනවා. නීත්‍යානුකූල පරිසරයක් තිබ්බා හෝ නැතා හෝ මානුෂීය පැත්තෙන් කල්පනා කරලා. අපි මන්ත්‍රීවරු 26 දෙනාටම එක් කෙනෙක්ට අඩු ගාණේ වීථි ලාම්පු පහක්වත් අළුතෙන් සවි කරගන්න මම කියන්නේ මේක සියලු දෙනාගේම අවශ්‍යතාවයක්. මොකද ඡන්දයක් කරලා අපි ඇතුළට එනකොට හැමෝම ඉල්ලනවා වීථි ලාම්පුවක් සවි කරලා දෙන්න කියලා. පක්ෂ විපක්ෂ කියලා බේදයක් නෑ. හැම දෙනාටම තියන පොදු ගැටලුවක් කියන්නේ මේක කොහොම හරි අපහසුතාවයෙන් හරි අපි කර ගන්න බලමු. අපි කරන්නේ නරක වැඩක් නෙමේ. වීථි ලාම්පුවක් සවි කරනවා කියලා කියන්නේ කාට හරි ආලෝකයක් ලබා දෙනවා කියන එක. සමහර වෙලාවට යම්කිසි සමිති ශාලාවක් ගාව නැත්නම් අපේම සහෝදර සහෝදරියෝ රාත්‍රියේ රැකියාවලට ගිහිල්ලා එනවා. ඇත්තටම, විශේෂයෙන් ඕනි තැන් තියනවා. නුංගමුව කන්ද ගත්තහම, කන්දෙ ගෙවල් තියනවා සමහර කනත්තවල් තියෙන තැන් තියනවා. ඒනිසා, විශේෂ ඉල්ලීමක් කරනවා අපේ ආදරණීය මන්ත්‍රීවරුන්ට සභාවෙන් අරන් දෙන්න පුළුවන් නම් වඩාත් හොඳයි. නැත්නම් අපි හරි සම්පත් දායකත්වයන් සොයා ගෙන අපිට කර ගන්න අවස්ථාව දෙන්න. ඒ වගේම අපේ සභාව ගත්තහම ගොඩක් සන්තෝෂ වෙනවා සභාපති තුමා ඇතුළු මන්ත්‍රීවරු 26 දෙනාම බොහොම සුහදශීලි මන්ත්‍රීවරු කොට්ඨාසයක් තමා මේ සඳහා තේරී පත් වී ඇත්තේ. හැමදෙනාම හොඳ මනුස්සයෝ. හොඳ සමාජ නායකයෝ. හැම දෙනාටම පක්ෂ බේදයක් නෑ. සහෝදරයෝ වගේ ඉන්නේ. අපි කමිටුවලදී දැක්කා. ඉතින් මන් මේ කියන්නේ මේ සහෝදරත්වය මේ බැඳියාව මේ සභාව පවතින තාක්කල් ගෙනියමු. මොකද අපේ ඔක්කොගේම අරමුණ සමාජයට සේවය කිරීම. මන්ත්‍රීවරු හැමදෙනාටම තේරෙනවා මිනිස්සුන්ගේ ප්‍රශ්නත් එක්ක මිනිස්සු වෙනුවෙන් තමන්ගේ පුද්ගලික ජීවිතය, වටිනා කාලය ශ්‍රමය, ධනය මේ සියලු දෙනාම කැප කරනවා. ඒ නිසා මම කියනවා සභාපතිතුමත් එක්ක එකතු වෙලා අපි 26 දෙනාම අපේ ගමට සභාව හරහා කරන්න පුළුවන් හැම කටයුත්තක්ම කරගන්න අපිට සභාවේ සහයෝගය ලබා දෙන්න. ඒ වගේම අනාගතයේදී මේ සභාවේ ආදායම වර්ධනය කරලා අපේ බල ප්‍රදේශයේ ජනතාවට අලච්ච ප්‍රාදේශීය සභාවේ අභිමානවත් ග්‍රාමීය නායකයෙක් කියලා කියන්න පුළුවන් විදිහට අපි සභාව දියුණු කරන එක යෝජනා කරමින්. ඒ වගේම යත්තල්ගොඩ මන්ත්‍රී තුමා කීවා වගේ අපේ ඩෙස් එක් හොඳ පෙනුමක් තියෙනවා.වැදගත්. වෙන සභාවල ගත්තහම සෙල්ෆි ගහලා දානවා අපිට එහෙම ගන්න අපහසුයි. ඇත්තටම මේ මට්ටමට හරි යම් දියුණුවක් ඇති කරලා තියනවා ඒකට සභාපති තුමාටත් ලේකම් තුමියටත් ආදරණීය මන්ත්‍රීවරුන්ටත් ස්තුතිය ප්‍රකාශ කරමින් නැවත නැවතත් 26 දෙනාටම එකා වගේ අපේ බල ප්‍රදේශයට සේවය කරන්න ඔබ තුමාගේත්, කාර්ය මණ්ඩලයේත් සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින්, ඔබ සැම දෙනාටම ජය පතමින් මම නිහඬ වෙනවා.බොහොම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි , වෙනත් කරුණු යටතේ මා අවස්ථාවක් කර ගන්නවා මෙවර පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් හුම්බුළුව කොට්ඨාසයෙන් සභාවට තේරී පත් කරලා එවපු ගැන ස්තුතිවන්ත වෙනවා. මම නියෝජනය කරන්නේ කැප්පිටිවලාන වසම. නමුත් යම් කාරණා නිසා හුම්බුළුව කොට්ටාශය මට ඉල්ලන්න සිද්ධ වුනා. ඒ සියලු ජනතාවට නැවතත් මම ප්‍රාදේශීය සභාවට තේරී පත් කිරීම ගැන එම ප්‍රදේශවාසී ජනතාව සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය මේ වෙලාවේ පුද කර සිටිනවා. එවගේම ඇත්තටම මේ අද සභාව බැලුවහම අපි ඉස්සරලා 28 දෙනා අර සභාවේ හිටියේ කොහොමද කියලා හිතා ගන්නත් බැහැ. ඉතින් ඇත්තටම මේ විදිහට හරි හුස්මක් කටක් අරගෙන ඉන්න පුළුවන් විදිහට මේක පරිවර්තනය වීම ගැන , මෙහෙම ලැස්ති කරපු එක පිළිබඳව, ලේකම්තුමියට හා අනෙක් සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. ඊළඟට විදුලි පහන් ගැනත් හුගක් කතිකාවක් ඇති වුනා. මම හිතන්නේ ඒක අපේ ප්‍රදේශයේ හැම කෙනෙක්ගේම ලොකු ඉල්ලීමක් . විශේෂයෙන්ම අපේ ගෙවල්වල පාර දිහා බැලුවම ඇත්තටම දිගටම ලයිට් තියනවා. හැබැයි ගේගාව ලයිට් එකයි, අපේ වැඩපල ගාව ලයිට් එකයි , දෙකම පිච්චිලා. ඒක ප්‍රශ්නයක් නැහැ. ජනතාවගේ ඉල්ලීම අනුව, ඒ අයට ඒවෙලාවේම ලයිට් එකක් දාලා දෙන්න බැරිනම් මම හිතන්නේ ඒක ලොකු අඩුපඩුවක්. ඒ නිසා අපි සියලු දෙනත් එක්ක කියපු කාරණාත් සමග මොනවා හරි වැඩ පිළිවලක් කරන්න කියන ඉල්ලීම මම ගරු සභාපතිතුමාගේ ඉල්ලනවා.ඒවගේම අපි බලාපොරොත්තු වෙනවා මෙපමණ කාලයක් පක්ෂ දෙකක් අතින් අතට ගිහිල්ලා විවේචනය කරමින් හැමෝටම බොරු වංචාව කියලා නියෝජනය කරමින් ඉදලා අද හොද පක්ෂයක් අතට ගිහිල්ලා තියනවා. ඉතින් අපි හිතනවා ඒ පක්ෂ දෙකට වැඩිය ඒ ප්‍රාදේශීය සභාව තුල ඉදිරියට යම් දෙයක් කරනවා නම් කරන්න පුලුවන් අවස්ථාව තිබෙන පක්ෂය හැටියට මම මේක දකිනවා. ඉතින් මෙතනින් එහාට යම් කිසි අකටයුත්තක් වෙලා අර විදිහටම යනවා නම් උනුත් එකයි මුනුත් එකයි එදා කිව්වාම,ඊට පස්සේ අරුනුත් එකයි කියලා කියන්න වෙන්නේ නැතිව මම හිතන්නේ අපි බලාපොරොත්තු වෙන්නේ ප්‍රදේශයේ ජනතාවට සේවය කරන්න. මේ දේශපාලනයේ කුඩාම තැන ඉන්නේ අපි. ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයා. අපි එදා තීන්දු තීරණ ගත්තේ ඉහලින් . අපි මොනවා කිව්වත් එම අපිට ඒ තීන්දු තීරණ හරවන්න වෙනස් කරන්න බැහැ. නමුත් ඒ වපසරිය තුල අපේ සීමාව ඉතාම පටුයි. ඒ නිසා අද නායකයෝ ඉන්නවා නම් හරියට හරිදේ කරන්න විශේෂයෙන් සභාපතිතුමාට මේ ප්‍රදේශයේ විශාල පුරවැසියා හැටියට, එතුමාට අපි සියලු දෙනා පක්ෂ , විපක්ෂ භේදයකින් තොරව එතුමාට යෝජනා කරපුවාම ඒවායින් හොද දේවල් වලට ඇහුම්කන් දීලා ඒ දේවල් තුලින් ජනතාවට සේවයක් කරන්න පුලුවන් ඒ ශක්තිය ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් ඔබ සියලු දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ වගේම පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමාලා, තුමියන්ලාගෙන් සහ අපේ ගරු ලේකම් තුමිය ඇතුළු නිලධාරී සියලු දෙනාගෙන්ම අවසරයි.

අද දිනයේ සභා වාරයේ වෙනත් කරුණු යටතේ කරුණු කිහිපයක් ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අලව්ව ප්‍රාදේශිය සභාවක් විදිහට අපි 26 දෙනාගේම එකම අරමුණ අභිප්‍රාය වන්නේ මේ ප්‍රදේශයේ ඉන්න සියලුම ජනතාව පක්ෂ භේදයකින් තොරව අපේ සේවය ලබා දීමයි. ඉතින් ඒ නිසා මම හිතන්නේ , ගරු සභාපතිතුමා , ඉතාමත් ඒ කර්තව්‍ය මනාව පැහැදිලි කරගෙන තිබෙන බව පෙනී යනවා. අපි කුමන පක්ෂයකින් තරග කරලා මේ සභාවට පත්වෙලා ආවත්, ඒ අපේ ගම්වල ඉන්න අපේ ජනතාව වෙනුවෙන් සේවය කිරීමට අපේ අරමුණක් තියෙන්න ඕනා. ඒ නිසා මම හිතන්නේ මේ පක්ෂයේ පක්ෂව 13කුත් විපක්ෂව මන්ත්‍රීවරු 13කුත් හිටියත්, මේ සියලු දෙනා මහජන ඡන්දයෙන් තේරී පත්වෙලා ආපු ගරු මන්ත්‍රීතුමන්ලා විදිහට අලව්ව ප්‍රාදේශීය සභාවෙන් ගමට , ප්‍රදේශයට කෙරෙන්න ඕනා යුතුකම් , අයිතිවාසිකම් හා වගකීම් මේ 26 දෙනාටම පොදුයි. ඒ නිසා අපි ගරු කරනවා. එවගේම ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ඒ ගන්නා සියලු ක්‍රියාමාර්ග සඳහා අපි ප්‍රමුඛත්වය දෙනවා. මූලිකත්වය දෙනවා . ඒ වගේම ඔබතුමාගේ යුතුකමක් පවතිනවා. කොයි පක්ෂයෙන් තේරිලා ආවත් අපි , අපේ වැඩි පිරිසක් ඉන්නේ දෙපාර තුන් පාර තේරිලා පත් වෙලා ආපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු.මන් හිතනවා ඔබ තුමන්ලාගේ රජයේ දැක්ම යටතේ මේ ඉන්න විපක්ෂ මන්ත්‍රීවරු පසුගිය වකවානු තුළ හොරකම්කලා නම් , දූෂණ වංචා කලා නම් මහජනතාව කවදාවත්ම ආපහු මේ ඉන්න මන්ත්‍රීවරු කණ්ඩායම තෝරලා එවන්නේ නැහැ, කියන එක ඔබ තමුන්නාන්සේලාගේ මතය වගේම අපේත් මතයයි. එනිසා අපිට දැන් ඉතිරිව ඇත්තේ එක එක පක්ෂවල අරමුණුවල , පක්ෂ

ප්‍රතිපත්ති එක්ක තියාගෙන, අලව්ව හදන මේ හොඳ වැඩපිළිවෙලට සියලු දෙනාම ඒකරාශිවෙලා වැඩ කරමුයි කියන එක තේමාව යටතේ තමයි අපි මේ ස්ථාවරේ ඉන්නේ. විශේෂයෙන්ම, අපි නොයෙකුත් පක්ෂවල තරග කරලා අන්තිමට මේ ඉන්නේ එකට හිටපු කණ්ඩායම්. විවිධ තමතමන්ගේ ඒ තින්දු තීරණ අනුව , තම තමන්ගේ රුචිකත්වය අනුව විවිධ පක්ෂවලට බෙදිලා තරග කරලා අපි ස්වාධිනව තරග කරලා කොට්ඨාසයක් දිනාගෙන මේ ප්‍රෙද්ශයට යමක් කරන්නට මිනිසුන්ගේ ජන ප්‍රසාදය හා ආශිර්වාද සමග තමා මේ සභාවට පැමිණුනේ. ඉතින් ගරු සභාපති තුමනි ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනවා. කොට්ඨාශ දෙකක් ජයග්‍රහනය කර අපි දෙදෙනා වගේම අනෙක් මන්ත්‍රීවරුන්ටත් ඒ අදාලව ලැබෙන වරප්‍රසාද අයිතිවාසිකම් ඒවාගේම විශේෂයෙන් වීථි ලාම්පු, යන්ත්‍ර සූත්‍ර ආදී සියලුම වැඩ කොටස් වලදි අපිට ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වගේම ඒ කටයුත්ත කරන්න විපක්ෂයටද ඒ සඳහා අවස්ථාව දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මේ අත්දැකීම් බහුල ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ගමක එකා මෙන් වැඩ කරපු , මම හිතන්නේ එවාගෙන් පස්සේ දේශපාලන වාසියකට වඩා මිනිසුන්ගේ යහපැවැත්මට මිනිසුන්ගේ දියුණුවට යම්කිසි රැකුලක් වෙනවා කියන එක මම විශ්වාස කරනවා. ඉතින් ඔබතුමා ඉතාමත් බුද්ධිමත්ව මේ සභාව මෙහෙයවනවා බව පෙනී යනවා. ඒ නිසා මම හිතන්නේ දේශපාලන වශයෙන් අපි, රටේ ඒ වගේම තමන්ගේ ප්‍රදේශයේ ගන්නා හොඳ තීන්දු සම්බන්ධව විශේෂයෙන් උදාහරණයක් ගත්තහම මේ රට විනාශ මුඛයට මජර දේශපාලනයන්ගේ නොයෙකුත් ක්‍රියාවලට මෙතන ඉන්න සියලු දෙනා ඒ ක්‍රයාවන් අනුමත නොකර ඔබ තමුන්නාසේලාගේ ඒ ක්‍රියාවන් සඳහා අපි සහයෝගය ලබා දීලා තියනවා. අපි විවේචනය කළහොත් හොරකම, වංචාව, දූෂණය අපි සමුපූර්ණයෙන් හෙලා දැකලා තියනවා. ඒක නිසා මා ඔබ තමුන්නාසේලාගේත් අපෙත් වෙනසක් දකින්නේ නැහැ. පක්ෂ වශයෙන් වෙනසක් ගත්තහම මොකද මේ සමාජයේ කුලකයක් ගත්තහම, ඒ,බී,සී කියලා පක්ෂ තුනම ගත්තහම, ඒ කියන්නේ ජාතික ජනබලවේගය , බී කියන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ , සී කියන්නේ ස්වාධීන කණ්ඩායම කියනවා නම්, ඒ කුලකය සමාජයේ හැදිච්ච කුලකයක් තමයිමේ ප්‍රාෙද්ශීය සභාවට තේරිලා පත්වීම. එතකොට මාලිමාව හෝ එහෙම නැත්නම් සජබ හෝ මේ අහහරු ලෝකෙන් ඇවිල්ලා ඡන්දය ඉල්ලලා මෙතෙන්ට ඒනනේ නැහැ. මේ සමාජකරණයේ ගැටිලා ඒ ප්‍රශ්නවලට උත්තර දීලා යම් දේශපානල රාමුවක් එක්ක මේ මාලිමාව මේ ආණ්ඩු පක්ෂය යම්කිසි හොඳ ස්ථාවරයක ඉන්නවා. හොරකමට, වංචාවට දූෂණයට කවදාවත් සහයෝගය දෙන් නැති හොඳ පක්ෂයක් විදිහට අපි අගය කරනවා. ඒ නිස, ඒ යන ගමනේදී හොඳ මිනිස්සු ඒකරාශි කරගෙන මේ අලව්ව ප්‍රාදේශීය සභාව ගොඩනගන්න , ඒ නියමුවා ලෙස ඔබ තමුන්නාන්සේ ඒ කටයුත්ත ඉතාමත් බුද්ධිමත් මේ අයත් එක්ක සහයෝගයෙන්, සමගියෙන් සහජීවනයෙන් බෙදා හදාගෙන ගියහොත් මම හිතන්නේ මේ ප්‍රෙද්ශයටත් ඔබ තමුන්නාන්සේලාගේ පක්ෂයටත්, ආණ්ඩුවටත් හොඳ ඍජු ප්‍රශංසනීක බලපෑමක්අත්වේ කියලා මා විශ්වාස කරනවා. ඒ නිසා මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මන්ත්‍රී තුමා කීවා බොහොම උජාරුවට පත්වුණා ඩෙස් එකක් හදලා සෙල්ෆියක් ගහන්න ඕනි කියලාඔ. ඉතාමත්ම දුක හිතනවා ඔබ තමුන්නාසේලා දැක්කා නම් අනිත් සභා බවනවල් ගේ කාගේ වරදද දන් නෑ. අපි අත් දෙකම උත්සලා සහයෝගය දෙනවා මේ සභාව හදන්න ජනතාවගේ ජන ජීවිතය නඟා සිටුවන්නට කිසිම වෙලාවක කකුළෙන් අදින් නෑ ඒ තැන අපි හිටගන්නවා කියන එක සපත කරමින් මා නිහඬ වෙනා.බෙහෙවින් ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි , ඇත්තටම වීථි පහන් සම්බන්ධයෙන් කතා කළා. ඒ නිසා මන් ඇත්තටම වීථි පහන් ගැන අදහසක් දක්වන්න කැමතියි. වීථි පහන් සවි කිරීමේදී මා හිතනවා සියලුම වීථි පහන් නිරීක්ෂණය කරලා බලපුවහම වීථි පහන් සමහර ඒවා අනවශ්‍ය විදිහට සවි කරලා තියෙනවා. ඒ කියන්නේ අපි දැන් ප්‍රාදේශීය සභාවට වීථි පහන් බිල ලක්ෂ 60 ක් ඇවිල්ලා කියලා එහෙම අපි කතා කරනවා. හැබැයි අපි සියලු දෙනාම එකතු වෙලා යම්කිසි ක්‍රමවේදයකට මේ වීථි හන් සවි කිරිම සම්බන්ධව සකස් කොට ඒ කියන්නේ තනි කෙලින් තියන පාරක නම්, කණු දෙකෙන් තුනෙන් එකක් හයි කරන්න නැත්නම් අත්‍යාවශ්‍ය ස්ථානයක නම් වීථි පහන් සවි කරන්න. අන්න එහෙම ක්‍රමවේදයක් අපි සකස් කරොත් මන් හිතනවා අපි අඩු පිරිවැයකින් ඒ දේ කරගන්නත් පුළුවන් වෙනවා. සභාවට එන විදුලි බිලත් අඩු වෙනවා. ඒ වගේ ක්‍රමවේදයක් අපි ඔක්කොම එකතු වෙලා හැදුවොත්, මන් හිතන්නේ අලව්ව ප්‍රාදේශීය සභාවටම ලොකු සම්පතක් වෙනවා. ඒ වගේම තමා, අපේ අතුකෝරාල මන්ත්‍රීතුමත්, නාරද මන්ත්‍රීතුමත් කීවා වගේ. අපි දේශපාලන ව්‍යාපාරයක් විදිහට යම්කිසි ජයග්‍රහණයක් ලැබුවෙම අපි රට තුළ දේශපාලන ව්‍යාපාරය ව්‍යාප්ත කරලා . අපේ ප්‍රධාන තේමාව වුණ හොරකම, වංචාව, දූෂණය නවත්වනවා කියලා. එතකොට

අපේ මූලික අරමුණත් ඒක. මන් හිතන්නේ මෙතන වාඩි වෙලා ඉන්න පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරු සියලු දෙනාම මෙතෙන්නට ඇවිත් ඉන්නේ, ජනතාවගේ විශ්වාසය මතයි. ඒ කියන්නේ, ඔබ තුමන්ලා නිවැරදි ගමනක් යයි කියන විශ්වාසය ජනතාව තුළ තියනවා. ඒ විශ්වාසය නිසා තමයි සියලුම දෙනාම සභාවට පත්වුණේ. අපි මේ රජයක් විදිහට ගෙනයන වැඩපිළිවෙලට සහයෝගයක් දෙයි කියලා මන් හිතනවා.මොකද අපිට අවශ්‍යයි මේ රට ගොඩනගා සිටුවන්න. මේ වැටිලා තියෙන ප්‍රපාතයෙන් ගොඩ එනවා දකින්න. මේ සියල්ල, උත්සාහ කරන්නේ, අපේ අනාගත පරපුර වෙනුවෙන් හොඳ ප්‍රදේශයක් නිර්මාණය කරන්න. ඉතින්, ඒ ප්‍රදේශය නිර්මාණය කරන්න අපි සියලු දෙනාම පක්ෂ විපක්ෂ බේදයකින් තොරව අපි හිට ගමු. අපි හරි දේ නිවැරදි දේ කරමු කියන ඉල්ලීම මන් කරනවා. මොකද අපිට අවශ්‍ය අලව්ව ප්‍රාදේශීය පුරවරය ගොඩ ගන්නවා දකින්න. ඒ නිසා දූෂණයෙන්, වංචාවෙන් තොර ප්‍රාදේශීය සභාවකුත්, රටකුත් නිර්මාණය කරන්න අලව්ව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී කණ්ඩායම විදිහට ඔබ සියලු දෙනාගේම සහයෝගය ගරු සභාපතිතුමා ප්‍රමුඛ ලේකම්තුමියටත් අපි සියලු දෙනාමත් ලබා දෙමුයි කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මන් වැඩි වෙලා කතා කරන් නෑ. අපි දේශපාලන ව්‍යාපාරයක් විදිහට හොරකම ගැන කතා කළා. දේශපාලන බලය ගන්න කියපු කතාවක් නෙවේ. ආණ්ඩුවේ විගණකාධිපතිවරයා පවසනවා ත්‍රිලියන අටක් ණය අරගෙන තියනවා. ඒකෙන්, ත්‍රිලියන දෙකක්. ඇත්තටම කියනවා නම්, ත්‍රිලියන 1.8 යි වත්කම් තියෙන්නේ. ඉතිරි ටික වත්කම් විදිහට නෑ. තමා අපි ඒ ප්‍රකාශය කරන්නට යෙදුණේ Tax anf figures පදනම් කරගෙනය. ඉතින් ඒක තමයි අපි නිවැරදි කරන්න ඕන කියන එක ජනගත කළේ. ඒ මත පිහිටලා මේ මොහොත වෙනකොටත් අපි ගත්ත ආණ්ඩුව රජය කටයුතු කරගෙන යනවා. ඉතින් ඒ නිවරදි කිරීම කරන්නයි මා නැඟී හිටින්නේ. ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මගේ කන්දෙගෙදර කොට්ඨාසයෙන් මගේ ජයග්‍රහණය වෙනුවෙන් මට ඡන්දය දුන් සියලු ජනතාවටත් අපේක්ෂයෙක් වශයෙන් මට ඉදිරිපත් වෙන්න ඒ අවස්ථාව දුන්න ගරු සංවිධායක නිලන්ත හේරත් මැතිතුමාටත් ගෞරවය ස්තූතිය පුද කරන සිටිනවා. ගරු සභාපතිතුමනි, කන්දෙගෙදර විහාරස්ථානයට මෙහා පැත්තේ තියෙන බෝක්කුව ගාව දෙපැත්තෙන්ම පාර ගිලා බසිමින් තියෙන්නේ. එතන ලොකු අනතුරක් සිද්ධ වෙන්න ඔන්න මෙන්න වගේ තියෙනවා. එතන තාර පාරයි පාලමයි තියෙන්නේ. එතකොට සාමාන්‍යයෙන්, රෝද හතරේ වාහනයක් යනකොට ඒ කට්ටිය දන්නැතුවහම එතන විශාල අනතුරක් සිද්ධ වෙන්න පුළුවන්. මුලින් තිබුණේ අලව්ව පැත්තේ ඉදලා යනකොට වම් පැත්තේ විතරයි. දැන් දකුණු පැත්තෙන් කාණුවට පාර හේදීගෙන යනවා. මට අවශ්‍ය කරන්නේ, ඒ ගැන ඔබ තුමාගේ කාරුණික අවධානය යොමු කරලා මහජනතාව වෙනුවෙන් ගමන් ගන්නා මිනිස්සු වශයෙන් ඒකට නිසි පිළිතුරක් දෙන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ ගරු උප සභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තූතිය පල කරන අතර අද දිනට නියමිත මහා සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 12.45 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2025.06.26
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.